1980 දශකයේ නූතන සිංහල කවියෙහි ප්‍රකට වූ පාරිසරික විචාරවාදී තේමා (පරාක්‍රම කොඩිතුවක්කු හා නන්දන වීරසිංහ යන කවීන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙන්)

[Exploring Key Themes of Ecocriticism in Modern Sinhala Poetry of the 1980s: A Study of Selected Works by Parakrama Kodithuwakku and Nandana Weerasinghe]

M.A. Dishan Madushanka[1]

Abstract

Ecocriticism is an interdisciplinary approach that emerged in Western literature around the turn of the 20th century. While ecocriticism remains a relatively new lens in Sri Lankan literary discourse, it has been applied more frequently to the modern Sinhala novel than to poetry. Consequently, this study seeks to address the question: What are the prominent themes of environmental criticism in selected works of modern Sinhala poetry from the 1980s? This research adopts a case study method, focusing on the work of two poetsParakrama Kodithuwakku and Nandana Weerasinghe who transformed various environmental phenomena of the 1980s into poetic expressions. The selected poems serve as key texts for analysis.The findings reveal that Parakrama Kodithuwakku's poems, such as 'Sinhajara Wadapala Gana Pethsamak', 'Aluth Para Mata Hinen Pennenne', and 'Wathura Ekka Yama', highlight themes like deforestation and rural development, which emerged as major environmental issues during that decade. Similarly, Nandana Weerasinghe, in poems such as 'Kolaniye Awanaduwa' and 'Kanthara Gamaka Upatha', explores the crisis of rural water resources and the commercialization of agricultural land. Although both poets are theoretically influenced by leftist ideology,Parakrama Kodithuwakku's approach to environmental themes appears more radical in comparison to the more nuanced tone found in the works of Nandana Weerasinghe.

Keywords: 80 decade, Deforestation and Water Conflict, Ecocriticism, Nandana Weerasinghe, Parakrama Kodithuwakkut

1. Lecturer (Probationary), Department of Sociology, University of Colombo.
E-mail: dishan@soc.cmb.ac.lk

1.1 හැඳින්වීම

මිනිසා ඉතිහාසයේ අත් නොදුටු ආකාරයේ විශාල පරිසර අර්බුද ගණනාවකට මේ වන විට මුහුණ දෙමින් සිටියි. ගෝලීය උණුසුම ඉහළ යෑම, වනහරණය, ජල දූෂණය හා ජනගහන වර්ධනය එම අර්බුද අතර කැපීපෙනේ (කරුණාරත්න, 2009). එබැවින් සොබාදහම සංරක්ෂණය කරමින් ඊට අනුරූප වන සේ මානව අවශ්‍යතා ද සම්පූර්ණ කිරීම පිළිබඳ ව ප්‍රතිසමාජ කතිකාවක් ලෝකයේ බිහි වී තිබේ. මෙය අන්තර් විෂයක කතිකාවකි. ආරම්භයේ එහි අධිපතිත්වය උසුලන ලද්දේ පරිසර විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව වැනි ස්වභාවික හා සමාජීය විද්‍යා කිහිපයකි (සිරිසේන, 2010). එහෙත් සොබාදහම සංරක්ෂණය කළ හැක්කේ හුදෙක් විද්‍යාත්මක මැදිහත්වීමකින් පමණක් නො වේ. පරිසර කේන්ද්‍රීය සාහිත්‍ය භාවිතයක ඇති වැදගත්කම මතුවන්නේ මෙවන් සන්දර්භයක ය. පාරිසරික විචාරවාදය ලෙස නව විචාර ප්‍රවේශයක් බිහිවන්නේ ද පෙර සඳහන් සාහිත්‍යයික හා සමාජීය අවශ්‍යතාව ඌනපූරණය කිරීම සඳහා ය (Biswas, 1998).

සාහිත්‍යයේ එතෙක් සාකච්ඡාවට ලක් නොවූ පරිසර තේමා මතුකිරීම හා පරිසරය පිළිබඳ සාහිත්‍ය නිර්මාණ මඟින් පාඨකාවතීර්ණ කෙරෙන දෘෂ්ටිවාද විචාරයට ලක්කිරීම පාරිසරික විචාරවාදය යටතේ සිදු වේ (Mishra, 2016). පාරිසරික විචාරවාදයේ ආභාසයට නවකතාව, කෙටිනවකතාව හා කෙටිකතාව යන ප්‍රබන්ධ සාහිත්‍යාංග මෙන් ම නූතන කවිය ද නතු ව තිබේ (Sutariya, 2020). කවිය නිශ්චිත සමාජ, දේශපාලනික හා පාරිසරික ප්‍රකාශනයක් බවට පත් ව තිබීමෙන් ම එහි අගය පෙර නොවූ විරූ ලෙස වර්ධනය වී තිබේ (Rao, 2019). එනම් නූතන කවිහු වර්තමානයේ පරිසරවේදීන්ගේ කාර්යභාරය ද ඉටුකරති. සොබාදහම රැකගැනීම සඳහා වන අරගලයේ දී කවිය ප්‍රබල සටන් මාධ්‍යයක් බවට පත් ව ඇති අතර සොබාදහම හා බැඳුණු මතවාද කාව්‍යාත්මක ව පාඨකාවතීරණ කිරීමෙන් නොනැවති ඒ පිළිබඳ ව සමාජ සංවාදයක් ඇති කිරීම උදෙසා ද නූතන කවීහු කටයුතු කරති. එම අර්ථයෙන් කවියෙහි ඇති සමාජශීලි හා බලපෑම්සහගත ගුණය සෙසු සාහිත්‍යාංගවලට වඩා පුළුල් බව අවිවාදයෙන් යුතු ව පිළිගැනීමට සිදු වේ (Rao, 2019).

නූතන සිංහල කවිය ද ඓතිහාසික, සමාජ හා විෂයමූලික කොන්දේසි යටතේ විකාශනය වෙමින් පවත්නා සාහිත්‍යාංග යකි. නූතන සිංහල කවියේ හැරවුම් ලක්ෂ, කාව්‍යය උපක්‍රම, කවියේ භාෂා විපරිණාමය සහ කවිය හා බැඳුණු දේශපාලන සංලක්ෂ යනාදිය සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පවත්නා විචාර සාහිත්‍යයක් බිහි ව තිබේ. එය සාහිත්‍ය නමැති විෂය පථයට පමණක් ලඝු නොවී වර්තමානයේ සෙසු සමාජීය විද්‍යා හා අනුකලනාත්මක ව ගොඩනැගෙන ප්‍රවාදයක් ද වී තිබේ (කරුණාරත්න සහ විජේසූරිය, 2019). කවිය සම්බන්ධයෙන් මෙම ප්‍රවර්ධනය ඇතිවන්නේ සාහිත්‍ය පෙරටුකරගත් පර්යේෂණ ක්‍රියාවලි හේතු කොට ගනිමිනි. මෙවන් පසුබිමක නූතන සිංහල කවියේ පරිසරාත්මක අක්ෂය සම්බන්ධයෙන් යොමුව ඇත්තේ ඌන අවධානයක් යැයි පැවසීම අතිශයෝක්තියක් නො වේ. කවියෙන් සොබාදහම වර්ණනා කිරීම හෝ පාරිසරික සංසිද්ධි කාව්‍යයාත්මක ව ඉදිරිපත් කෙරෙන අවස්ථා සුලභ වුව ද පාරිසරික විචාරවාදය වැනි විචාර සම්ප්‍රදායක පිහිටා නූතන සිංහල කවිය පිළිබඳ අවලෝකනයේ යෙදුණු අධ්‍යයන ඇත්තේ ඉතා අතලොස්සකි. පාරිසරික විචාරවාදය බටහිර ද මතු වූ නව සාහිත්‍ය ප්‍රවේශයකි. එතකුදු වුව ද එය බිහි ව දශක 04කට ආසන්න කාලයක් ගෙවී ඇතත් එය ලාංකේය සාහිත්‍ය කතිකාවෙහි තවමත් අංකුර ධාරාවක් වී ඇත්තේ ඇයි ද? යන්න ගවේෂණයට ලක්විය යුතු ය. එම විස්තෘත

අරමුණෙහි පිහිටා මෙම පර්යේෂණයෙන් විභාග කර ඇත්තේ 1980 දශකයේ නූතන සිංහල කවියේ ඇතැම් කාව්‍ය නිර්මාණ මඟින් ප්‍රකට වන පාරිසරික විචාරවාදී තේමා කවරේ ද? යන ප්‍රවාදය යි.

1.2 පර්යේෂණ ගැටලුව

1980 දශකයේ නූතන සිංහල කවියේ ඇතැම් කාව්‍ය නිර්මාණ මඟින් ප්‍රකට වන පාරිසරික විචාරවාදී තේමා කවරේ ද?

ශ්‍රී ලංකාවේ 1980 දශකය යනු ඉමහත් විපරිවර්තන සිදු වූ කාල පරාසයකි. විශේෂයෙන් ම දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍ර ආශ්‍රිත ව මෙම වෙනස වඩාත් විද්‍යමාන වූ අතර සාහිත්‍යයේ භූමිකාව පිළිබඳ ව ද එකල විචාරවාද මතු විය. එබැවින් 80 දශකයේ නූතන සිංහල කවිය වනාහි එම අවධියේ වූ සමාජ දේශපාලන ගැටීම්හි ඵලයකි. එමෙන් ම 80 දශකය ලෙස මෙහි ලා සඳහන් වුවත් එය 1970 දශකයේ ම ඉදිරි දිගුවක් ලෙස අවධාරණය කළ හැකි ය (ආනන්ද හිමි, 2015).

1970 දශකය ආරම්භයේ දී ඇති වූ 71 විප්ලවය මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු සංසිද්ධියකි. පැවති සංවෘත ආර්ථිකයේ පීඩාකාරීභාවය, කුල අසමානතාව හා ඉහළ සමාජ අවකාශ සඳහා වූ අවස්ථා සීමිත වීම වැනි හේතු මඟින් වර්ධනය වූ සමාජ අසහනය ප්‍රකාශ වූයේ සන්නද්ධ අරගලයක් මතිනි (සිල්වා, 1997: 117). එබැවින් 71 විප්ලවයෙන් ඇති කළ සමාජ ප්‍රකම්පනය සුළුපටු එකක් නො වේ. එය සිනමාව, දේශපාලනය, කලාව හා සාහිත්‍ය වැනි ශානර ගණනාවක් කෙරෙහි බලපෑම් එල්ල කරනු ලැබීය. 80 දශකයේ විරෝධාකල්ප සාහිත්‍ය ලෙස ප්‍රකාශයට පත්වූයේ එහි ම ඉදිරි දිගුවකි (ආනන්ද හිමි, 2015).

1970 දශකය අගභාගයේ දී සිදු වූ දෙවන සමාජ විපරිවර්තනය වූයේ නව ආර්ථික සුසමාදර්ශයක් මෙරටට හඳුන්වාදීම යි. එය විවෘත ආර්ථිකය ලෙස ජනප්‍රිය අර්ථයෙන් හඳුනාගනු ලැබුව ද ශ්‍රී ලාංකේය ජන සමාජය නවලිබරල් ප්‍රාග්ධනය සඳහා විවෘත කිරීමක් ලෙස අර්ථකථනය කළ හැකි ය. (Athukoarala and Rajapathirana, 2000). විවෘත ආර්ථික ක්‍රියාවලියේ දේශපාලන මුහුණුවරය වූයේ සංවර්ධනය යි. එය යටිතල පහසුකම් සංවර්ධනය ලෙස ද අවධාරණය කළ හැකි ය (හෙට්ටිආරච්චි, 2015:01-08). 80 දශකයේ සාහිත්‍ය බිහිවූයේ මෙවැනි සංකීර්ණ සමාජ සන්දර්භයක් ආශ්‍රිත ව ය. සැබෑ ලෙස ම 80 දශකය යනු ඉහත සාකච්ඡා කළ සමාජ විපරිවර්තනයන්හි ව්‍යවහාරික ස්වරූපය වඩාත් විද්‍යමාන වූ දශකය යි. මෙම සමාජ වෙනස අත්දුටු, ඒවා කුතුහලයෙන් ප්‍රශ්න කළ බලවේග අතර සාහිත්‍යකරුවා ද වැදගත් සමාජ ආස්ථානයක් නියෝජනය කළේ ය. සාහිත්‍යකරුවාගේ මාධ්‍යය එම අවධියේ හුදු රසභාවය අතික්‍රමණය කළ බුද්ධිය විසංයෝජනය කළ ප්‍රකාශනයකි. විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණ හේතුවෙන් බිහිවෙමින් පැවති සමාජ ඇවතුම් පැවතුම් හා වඩාත් සුවිශේෂ ව පරිසර අර්බුද එකල විසූ කවීහු සිය අනුභූතිය බවට පත්කරගත්හ. 80 දශකයේ සාහිත්‍ය දුර්මුඛ කිරීමට එවක පාලක පැළැන්තිය උත්සුක වූයේ ද කවිය, කෙටිකතාව වැනි සාහිත්‍ය භාෂණයේ වූ ප්‍රබලත්වය නිසා ය (ආනන්ද හිමි, 2015).

එබැවින් 80 දශකයේ සාහිත්‍ය යනු හුදෙකලා ප්‍රකාශනයක් නො වේ. එය පෙර සඳහන් කරන ලද 70 දශකයෙන් ඇරඹී සමාජ විසංවිධානයේ ම එක් සන්ධිස්ථානයකි. 80 දශකය පමණක් වියුක්ත ව ගෙන එහි නිර්මාණ රස විඳීම හරසුන් ව්‍යායාමයක් වන්නේ එබැවිනි. 80 දශකයේ කවිය පිළිබඳ ව විශේෂ අවධානයක් මෙහි ලා යොමු කිරීම වැදගත් වේ. කෙටිකතාව හා නවකතාව වැනි සාහිත්‍ය ප්‍රභේද යටතේ එකල ඇති වූ සමාජ විපර්යාස නිරූපණය වූ නමුදු පරිසර ආඛ්‍යාන නිරූපණය වීම අවම විය (සෝමරත්න, 2013). එහෙත්

එකල විසූ කවීන් අන් සාහිත්‍යකරුවන්ට සාපේක්ෂ ව පරිසර සංසිද්ධි කෙරෙහි වඩාත් නිරාවරණය වී ඇති බව හඳුනාගත හැකි ය.

80 දශකය නියෝජනය කළ කවීන් යටතේ පරාක්‍රම කොඩිතුවක්කු, හා නන්දන වීරසිංහ යන කවීන් දෙදෙනා හා ඔවුන්ගේ තෝරාගත් කාව්‍ය නිර්මාණ කිහිපයක් මෙහි ලා පාරිසරික විචාරවාදී අක්ෂ ඔස්සේ විමර්ශනය කර ඇත. පොදුවේ මෙම කවීන් දෙදෙනා ම සමාජ ක්‍රමයක් ලෙස වර්තමානයේ අප මුහුණ පා ඇති පාරිසරික අර්බුද හා බැඳුණු සංස්කෘතික ගැටීම් සම්බන්ධ සිය කාව්‍යමය සංවේදිතාව එම අවධියේ සිට ම ප්‍රකට කළෝ ය. වර්තමාන නව කවීන් පිළිබඳ අවලෝකනයේ දී 80 දශකයේ කවිය හා එහි පාරිසරික අක්ෂ ගවේෂණය කිරීම වැදගත් වන්නේ එබැවිනි.

1.3 ප්‍රධාන අරමුණ

1980 දශකයේ නූතන සිංහල කවියේ හඳුනාගත හැකි පාරිසරික විචාරවාදී තේමා විභාග කිරීම

1.4 පර්යේෂණ ක්‍රමවේදය

1.4.1 අධ්‍යයන ක්ෂේත්‍රය හා දත්ත රැස් කිරීමේ විධික්‍රම

මෙම අධ්‍යයනය සඳහා පාදක කර ගන්නා ලද්දේ සිද්ධි අධ්‍යයන විධික්‍රමය යි. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා විෂය කරගන්නා ලද අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ 1980 දශකයේ නූතන සිංහල කවිය යි. වඩාත් සුවිශේෂ ව විමසා බලන කල එය ද නූතන සිංහල කවිය නම් වූ පෘථුල ක්ෂේත්‍රයට අයත් එක් අධ්‍යයන ධාරාවකි. 80 දශකයේ සිංහල කාව්‍යකරණයට අවතීර්ණ වූ කවීන් බොහෝ ප්‍රමාණයක් ඇතත් පාරිසරික සංසිද්ධීන් සිය අනුභූතිය බවට පත් කරගත් කවීන් ඇත්තේ අතළොස්සකි. උක්ත සන්දර්භයෙහි පිහිටා අරමුණු සහගත නියැදි ක්‍රමය අනුගමනය කරමින් මෙම සිද්ධි අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලද කවීන් දෙදෙනෙකි. පරාක්‍රම කොඩිතුවක්කු, හා නන්දන වීරසිංහ එම කවීන් දෙදෙනා වේ.

මෙම අධ්‍යයනය පුස්තකාල පර්යේෂණයක් ලෙස හඳුනාගත හැකි අතර එහි දී ද්විතීයික දත්ත රැස්කිරීමේ විධික්‍රම භාවිත කරන ලදි. ද්විතීයික දත්ත රැස්කිරීම් යටතේ කොළඹ ජාතික පුස්තකාලය ප්‍රධාන පර්යේෂණ අවකාශය ලෙස භාවිත කරමින් පාරිසරික විචාරවාදය හා නූතන සිංහල කවිය සම්බන්ධයෙන් දැනට ලියවී ඇති ද්විතීය පර්යේෂණ මූලාශ්‍රයය ඇසුරු කරගන්නා ලදි.

02. සාහිත්‍ය විමර්ශනය

පාරිසරික විචාරවාදය යනු පරිසරය පිළිබඳ ව වන විචාරාත්මක ප්‍රවේශ එකතුවකි. එය හරිත සංස්කෘතික අධ්‍යයනය ලෙස ද හඳුන්වන අතර සමකාලීන ව චිත්‍රපට, රූපවාහිනී, ජනප්‍රිය සංස්කෘතිය හා සමාජ මාධ්‍ය වැනි නව මාන කරා ද මෙම විචාර ධාරාව ව්‍යාප්ත ව පවති. පාරිසරික විචාරවාදය පරිසර විද්‍යාව (Ecology) සහ විචාරවාදයේ (Criticism) මනා සුසංයෝගයකි. එහි ඉංග්‍රීසි භාෂා යෙදුම වන්නේ Ecocriticism යන්න යි (බ්‍රිටැනිකා විශ්වකෝෂය, 2022). පාරිසරික විචාරවාදය බටහිර එනම් ඇමරිකා එක්සත් ජනපදය විෂය කරගනිමින් බිහි වූ විචාර සම්ප්‍රදායකි. එහි ලා 19 වන සියවසේ ලෝකෝත්තරවාදී (Transcendentalism) සාහිත්‍ය සම්ප්‍රදාය නියෝජනය කළ රැල්ෆ් වොල්ඩෝ ඉමර්සන්, මාග්‍රට් ෆුලර් හා හෙන්රි ඩේවිඩ් වැනි ඇමරිකානු සාහිත්‍යකරුවන්ගේ පුරෝගාමී මැදිහත්වීම කැපී පෙනේ (Merchant, 2017).

එහෙත් නූතන පාරිසරිකවාදය බිහිවන්නේ 1960 දී පමණ වේ. ප්‍රකට ඇමරිකානු පරිසරවේදිනියක වූ රැචල් කාර්සන් විසින් 1962 දී ප්‍රකාශයට පත් කරන ලද නිහඬ වසන්තය ‘Silent Spring’ නමැති කෘතිය

ලොවපුරා සිටින පරිසරවේදීන්ගේත්, සාහිත්‍යවේදීන්ගේත් නොමද අවධානය දිනාගත් කෘතියක් විය. මෙලෙස සාහිත්‍යයික හා සමාජීය ක්ෂේත්‍රයන්හි පරිසරය සම්බන්ධයෙන් ඇති වූ ප්‍රබෝධය නූතන පාරිසරික විචාරවාදය බිහිවීමෙහි ලා හේතුපාදක වී ඇත (Merchant, 2017).

කෙසේ වුව ද පාරිසරික විචාරවාදයේ වර්ධනය ඒකරූපී රටාවකට අනුව සිදු වූවක් නො වේ. එහි ආරම්භය 1960 දී පමණ සනිටුහන් වුවත් නව ශික්ෂණයක් ලෙස එය වර්ධනය වූයේ මන්දගාමී ව ය. එය විධිමත් ආයතනිගත විෂය ධාරාවක් වන්නේ 1993 තරම් මෑතක දී ය. ඒ ඇමරිකා එක්සත් ජනපදයේ සාහිත්‍ය සහ පරිසර අධ්‍යයන සංගමය පිහිටුවීමත් සමඟ ය. පාරිසරික විචාරවාදය අනතුරුව යුරෝපා සාහිත්‍ය ප්‍රවාදයන්හි සුලභ සාකච්ඡා මාතෘකාවක් බවට පත් විය. එය එක්සත් රාජධානියේ ප්‍රකාශයට පත්වූයේ හරිත අධ්‍යයන (Green Studies) යන නමිනි. ඇමරිකා එක්සත් ජනපදයේ ලෝකෝත්තරවාදී සාහිත්‍ය ආභාසය ලත් සාහිත්‍යවේදීන් පාරිසරික විචාරවාදය බිහි වීමට යම් අඩිතාලමක් සපයන ලද්දේ යම්සේ ද, එලෙස ම බ්‍රිතාන්‍යය රොමාන්තිකවාදී සාහිත්‍යවේදිහු මෙම කර්තව්‍යයේ පෙරමුණ ගත්හ. ඔවුන් අතර සර්පිල් ඔපර්මන්, ස්කොට් සොල්වික්, ග්‍රේග් ගැරඩ් හා ලෝරන්ස් බුවෙල් වැන්නෝ සුවිශේෂ වෙති (Garrard, 2014).

පාරිසරික විචාරවාදී තෙවන ධාරාව 21 වන සියවසේ දී වඩාත් ප්‍රගමනයට ලක්වන්නේ අන්තර්විෂයික ශික්ෂණයක් වශයෙනි. එනම් සොබාදහමේ සෞන්දර්යාත්මක අක්ෂ නියෝජනය කළ පාරිසරික විචාරවාදය නව මාන කරා වේගයෙන් ව්‍යාප්ත වීම මෙම තෙවන ධාරාවේ හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඒ අතර පාරිසරික ස්ත්‍රීවාදය, පාරිසරික මාක්ස්වාදය, පාරිසරික සිනමාව හා වේදිකාව, පාරිසරික මානව විද්‍යාව, පාරිසරික යටත්විජිත හා පශ්චාත් යටත්විජිත අධ්‍යයන යන නව දිශානතීන් ඔස්සේ වර්ධනය වෙමින් තිබේ (Marland, 2013:848-855).

03. අධ්‍යයන සොයාගැනීම්

3.1 වනහරණය හා ග්‍රාම සංවර්ධන කතිකාව විමර්ශනය කිරීම

වනහරණය පරිසර අර්බුදයක් බවට පත් ව ඇත්තේ හුදෙක් කේන්ද්‍රීය දියුණු රටවල පමණක් නො වේ. එය පරිධිය නියෝජනය කරන ශ්‍රී ලංකාව වැනි නව රාජ්‍යයන් ද මේ මොහොතේ මුහුණදෙමින් සිටින වාදවිෂයක් (issue) වී ඇත (Brayant & Bailey, 1997). ශ්‍රී ලංකාවේ යටත්විජිත අවධියෙහි වනහරණ ක්‍රියාවලියක් සිදු ව ඇතත් එහි වර්ධනයක් ඇතිවන්නේ 1977 හඳුන්වාදුන් නවලිබරල් ප්‍රතිසංස්කරණවලින් පසු ව ය. මෙමඟින් ප්‍රාග්ධන අවශ්‍යතා උදෙසා වනාන්තර ඇතුළු ස්වභාවික සම්පත් පාලනය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කෙරිණි. එමෙන් ම ග්‍රාම හා කර්මාන්ත සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා ස්වභාවික සම්පත් තිරසරාත්මක ව යොදාගැනීමේ සංවාදය ද මතු වූයේ මෙවන් සන්දර්භයකය (Athukorala & Rajapathirana, 2000).

80 දශකයේ ඇති වූ මෙම විපරිවර්තනය එවක සිටි බුද්ධිමය ධාරා ගණනාවකට බලපෑම් කළ අතර මෙම අධ්‍යයනයට විෂයක කරගන්නා ලද පරාක්‍රම කොඩිතුවක්කු හා නන්දන වීරසිංහ යන කවීන් දෙදෙනා 80 දශකයේ පරිසර කාව්‍යයේ මුල් ස්වරූපය හැඩගැන්වූවෝ වෙති. ඔවුන් දෙදෙනා ම තමන්ට අනන්‍ය දෘෂ්ටි පරාසයන්හි පිහිටා කවියෙන් වනහරණ කතිකාව පාඨකාවතීර්ණ කර ඇත. පරාක්‍රම කොඩිතුවක්කු සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක් හා අලුත් පාර මට හීනෙන් පෙනෙන්නේ යන පද්‍ය නිර්මාණ මඟින් වනහරණය හා බැඳුණු සංවර්ධන අවශ්‍යතාව ඉසියුම් ව මතුකර ඇති අතර ‘කාන්තාර ගමක උපත කවි පන්තිය මඟින්

නන්දන වීරසිංහ සිය වනහරණ අනුභූතිය ඉදිරිපත් කර තිබේ.

සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක්

සිංහරාජ වනහරණ කතිකාව

සිංහරාජ වැසි වනාන්තරය ලෝක උරුමයකි. එහි පවත්නා ජෛව විවිධත්වය සහ විරල ශාක හා සත්ත්ව ගහණය හේතුවෙන් ගෝලිය වශයෙන් ඉහළ වැදගත්කමක් හිමිකරගත් ස්වභාවික සම්පතක් වී තිබේ. සිංහරාජ වැසි වනාන්තරය යනු සෑම කාලවකවානුවක දී ම සාකච්ඡාවට තුඩු දුන් සංවේදි පරිසර කලාපයකි (ලියනගෙදර, 2020).

ලංකාගම සිට සිංහරාජය දක්වා ඉදිවන මාර්ගය එහි මෑතාසන්න අත්දැකීම වූ අතර මෙම සංවර්ධනය හේතුකොටගෙන ඉහළ සමාජ, දේශපාලනික හා පාරිසරික කතිකා මෙම අවධියේ නිර්මාණය විය. සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක් නම් වූ මෙම කවි පන්තිය පරාක්‍රම කොඩිතුවක්කු කවියා රචනා කර ඇත්තේ පෙර සඳහන් පරිදි 1970 දශකයේ දී ය. එනම් ඉන් අදහස් වන්නේ සිංහරාජ තෙත් කලාපීය වන රක්ෂිතය එම අවධියේ ද ප්‍රධාන සාකච්ඡා මාතෘකාවක් ව තිබූ බව යි (ලියනගෙදර, 2020).

විශ්ලේෂණය වඩාත් කේන්ද්‍රගත වනු පිණිස සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක් යන පද්‍ය නිර්මාණය මෙහි ලා පාදක කරගනු ලැබුව ද කොඩිතුවක්කු කවියා සිංහරාජය පිළිබඳ පද්‍ය ත්‍රිත්ත්වයක් රචනා කර ඇත. එහි දෙවන පද්‍ය නිර්මාණය සිංහරාජ වැඩබිමේ ඇබෑර්තු ඇත. යනුවෙන් නම් කර ඇති අතර සිංහරාජ ආරක්ෂිත වනය විදේශාධාර ක්‍රමය අවසර නොගෙන ඇතුළුවීම තහනම් යන මාතෘකාව යටතේ තෙවන පද්‍ය ඉදිරිපත් කර තිබේ.

අධිසංවේදී පරිසර කලාපයක් වන සිංහරාජයේ වැඩපළක් නිර්මාණය වීම අප කවියා අත්දුටු පළමු සංසිද්ධිය වන අතර මෙම වැඩපළෙහි පවත්නා කුඨ ස්වභාවය අවධාරණය කරමින් පෙත්සමක් ලිවිය යුතු බව ඔහු සිතයි. වැඩපළ ක්‍රමයෙන් සක්‍රීයවත් ම ඒ සඳහා ඉහළ ශ්‍රම බලකායක් අවශ්‍ය වේ. ඇබෑර්තු විවෘත වන්නේ එබැවිනි. සේවකයන් ලෙස මෙහි ලා බඳවාගනු ලබන්නේ සිංහරාජය අවට වසන ගැමියන් ය. අවසන සිංහරාජය විදේශාධාර නොහොත් බහුජාතික සමාගම් යටතේ නියාමනය වන සම්පතක් බවට පත් වේ. එය තව දුරටත් අපගේ සම්පතක් නො වේ. කොඩිතුවක්කු කවියා සිය අධිරාජ්‍ය විරෝධීවාමවාදී ආස්ථානය කවියෙහි අන්තර්ග්‍රහණය කර ඇත්තේ මෙසේ ය.

“සුදු මහතුන්
එක රැයින් හැදූ යකඩ පාලමෙන්
ගමන් කරයි
යකඩ ඇත් පෙරහැරක්
සිංහරාජ වනාන්තරයට
ආදි අපේ සිංහරාජේ
කොහොඹ දෙයියන්ගේය
ඉන් ඉක්බිති,
දිසාපති හාමුදුරුවන්ගේය
දැන් බදු අරගෙන
සුදු මහත්වරුන්ගේය
වැද්දාගල ගම්මානේ දිගට
ගමේ රාළලා උන්නැහේලා
හාමිනේලා උන්ගේ පුංචලා
බලා සිටිති පේළි ගැසී
යකඩ අලි දිහැ
කට ඇරගෙන

පස් පෙරළන බුල් ඩෝසර් අලි ඇත්තු

මිවිගන් ටිම්බ ජැක් ගස් අදිනා සත්තු

සිංහරාජේ ගස් කපනා මේ ඇත්තු

ගම්මුන්ගේ සොඳ කරුණා ලැබ ගත්තු

‘කරුණාවයි

ඉංග්‍රීසි මහත්වරු’

හෙලු කොල්ලන් වඩාගනිති

විස්කෝතු ටොපී දෙති

ජනෙල්වලට අත වනති’’ (කොඩිතුවක්කු, 1975: 137)

සිංහරාජ වන රක්ෂිතය යනු මිනිස් වාසයෙන් තොර හුදෙකලා පරිසර කලාපයක් නො වේ. වාරුකන්දෙණිය, පිටදෙණිය හා කොලොන්කටුව ආදි ගම්මාන මෙම සංවේදී වන රක්ෂිතයේ පිහිටා තිබේ. වනාන්තරය සහ මෙම ගම්මාන පද්ධතිය අතර ඉහළ තිරසරාත්මක සම්බන්ධතාවක් ඇත අතීතයේ සිට ම පැවත ඇත. එනම් වනයේ පැවැත්මට ද හානියක් නොවන පරිදි සිය මානව හා සංස්කෘතික අවශ්‍යතා සංතෘප්ත කර ගැනීමට ගැමියෝ කටයුතු කළහ (ලියනගෙදර, 2020). මෙම තුලනාත්මක සම්බන්ධතාව බිඳ වැටීමට ලක්වන්නේ සිංහරාජය වැනි ස්වභාවික සම්පත් වෙළෙඳපළ බලවේග යටතේ පාලනය වීම මඟින් ය.

සුදු ජාතික අධිරාජ්‍යවාදීන් විසින් සිංහරාජ වනාන්තර පද්ධතිය අනුක්‍රමික ව කපා විනාශ කරන අයුරු හුදු කාව්‍යයට නැඟීම පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ අභිලාෂය නොවීය. මෙම වනසංහාරය සිදු වන්නේ සිංහරාජ වනාන්තර කලාපයේ ජීවත් වන ගැමියන් කිසියම් මනෝ ආස්වාදයක හෙවත් දෘෂ්ටිවාදයක සිරගත කරමින් ය. සුදු අධිරාජ්‍යවාදයේ විද්‍යා හා තාක්ෂණික දියුණුව, ව්‍යාජ මානව හිතවාදීත්වය ගැමියන් විස්මයට පත් කෙරෙන සංරචක අතර වේ. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම නව අධිරාජ්‍යවාදීහු සිංහරාජයට විනකටිනුයේ ගැමියන්ගේ කරුණාව මධ්‍යයේ ය.

එබැවින් සිංහරාජය දෙදරවන වැඩපළ සම්බන්ධ පෙත්සම කා හට ඉදිරිපත් කළ යුතු ද යන පැනය මතු වේ. කවියා එම පෙත්සම මහජන උසාවියකට ඉදිරිපත් කරනවා විය හැකි ය. එම අර්ථයෙන් ග්‍රාමීය සම්බන්ධතා වෙළෙඳපළකරණයේ ගොදුරක් වන ආකාරය සහ එහි ම ආශීර්වාදය යටතේ සිංහරාජය ආශ්‍රිත ව වනසංහාරයක් සිදු වන බව අවධාරණය කිරීම මෙම කවි පන්තියෙන් ඉදිරිපත් කෙරෙන පරිසර කතිකාව ලෙස අවබෝධ කරගත හැකි ය.

සිංහරාජය නව යටත්විජිතකරණයට නතුවීම

යථෝක්ත පැදිපෙළ පාරිසරික විචාරවාදයේ කිනම් ආස්ථානය නියෝජනය කරන්නේ ද යන්න මෙහි ලා විශ්ලේෂණයට නතු කෙරේ. පළමුකොට ම එය දේශපාලන ප්‍රකාශනයක් බව හඳුනාගත හැකි ය. එනම් කවියෙන් දේශපාලනය කරන කවීන් අතර කොඩිතුවක්කු කවියා පෙරමුණේ පසු වේ (සෝමරත්න, 2013). මෙම පැදිපෙළ නව අධිරාජ්‍යවාදයේ ස්වරූපය පිළිබඳ කාව්‍යමය ඇඟවුමක් වැන්න.

පැරණි සුදු අධිරාජ්‍යවාදයේ ඍජු මුහුණුවර හා එහි පැවති කයෝර බව අපි විවිධ ස්වරූප ඔස්සේ අත්විඳ ඇත්තෙමු. යටත් විජිතවාදීන්ට එරෙහි ව ලියවුණු ඉපැරණි හටන් කාව්‍යයන්හි අධිරාජ්‍යවාදයේ ඇති අමානුෂික බව මනාව මතුකර දී ඇත. එහෙත් නව අධිරාජ්‍යවාදය එසේ නො වේ. එය සියලු ම අතිඅමානුෂිකත්වයන් සඟවා ගත් ක්ෂේම භූමියක් හා සමාන ධාරාවකි. එහි ඇත්තේ බලය යොදවා පහර දී යටත්කර ගැනීමට වෙනුවට විඳිදිතයා ද මනෝරාජික ලෝකයක සිරකොට තම

ග්‍රහණයට ගැනීමේ පිළිවෙත යි (සමාජවාදී කම්කරු සංගමය, 2013).

නවලිබරල් වෙළෙඳපළ සමාජය හා ධනේශ්වර සුරාකෑම ප්‍රසාරණයෙහි ලා තව දුරටත් දෘඪ න්‍යාය අනුගමනය කළ නොහැකි බව ධනේශ්වර වියත්හු පිළිගත්හ. එහෙයින් ඔවුහු වඩාත් සූක්ෂ්ම ව හා මතවාදාත්මක ව සිය අධිරාජ්‍යවාදී පිළිවෙත අනුගමනය කිරීමට යොමු වූහ. එබැවින් සුදු අධිරාජ්‍යවාදය යනුවෙන් සඳහන් වුවත් එහි ලා ඉපැරැණි අධිරාජ්‍යවාදී පිළිවෙත හා අදාළ නිලධාරින් සිහියට නගාගත යුතු නො වේ (සමාජවාදී කම්කරු සංගමය, 2013).

අධිරාජ්‍යවාදයේ ඇති වූ මෙම ක්‍රම වෙනස එකල සිටි මාක්ස්වාදී වියතුන් කොතෙක් දුරට අවබෝධ කරගත්තේ ද යන්න ගැටලුවකි. ඔවුන් නවලිබරල්වාදයට එරෙහි ව විවේචන ඉදිරිපත් කරනු විනා එහි අභ්‍යන්තරයේ වූ නිර්දය සූරාකෑමේ අභිලාෂ මනාව කියවා ගත්තේ ද යන්න අපැහැදිලි ය. එමෙන් ම 80 දශකයේ ජනතාවාදී කාව්‍යකරණයේ නියුතු බොහෝ නූතන සිංහල කවීන් මෙය නිවැරදි ව ප්‍රමාණ කළේ ද යන්න විමසිය යුතු ය. එහි ලා පරාක්‍රම කොඩිතුවක්කු කවියා යම් පුරෝගාමී ප්‍රවේශයක් අනුගමනය කරන ලද කවියෙකු බව පැහැදිලි ය. ඔහුගේ සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක් නම් වූ උක්ත කවි පන්තිය අධිරාජ්‍ය වාදයේ ව්‍යාජ ස්වරූපය විවරණය කෙරෙන කාව්‍යය ආඛ්‍යයානයකි.

‘කරුණාවයි

ඉංග්‍රීසි මහත්වරු’

හෙලු කොල්ලන් වඩාගනිති

විස්කෝතු ටොපී දෙති

ජනෙල්වලට අත වනති
(කොඩිතුවක්කු, 1975: 137).

වෙළෙඳපළ සමාජයේ චිර පැවැත්ම උදෙසා ස්වභාවික සම්පත් අත්පත් කරගත යුතු ය. ඒවා කුට ලාභ උපයන ව්‍යාපාර බවට පත් කළ යුතු ය. සුදු අධිරාජ්‍යවාදී බහුජාතික සමාගම් මෙම ක්‍රියාවලියෙහි නියුතු විය යුත්තේ සෘජු ආක්‍රමණ ස්වරූපයෙන් නො වේ. සංවර්ධනයේ නාමයෙන් ව්‍යාජ කරුණාවක් අප වැනි ආන්තික සමාජ වෙත හෙළිය යුතු ය (Athukorala & Rajapathirana, 2000). සුදු අධිරාජ්‍යවාදීහු කුඩා දරුවන් වඩාගනිති. රසකැවිලි ප්‍රදානය කිරීමෙන් නොනැනවති ඔවුහු කරුණාබරිත ව දරුවන්ගේ නිවාසවලට යති. වැඩිහිටියන් පූර්වයේ පැවසූ තරම් සුදු මහත්වරු නරක අය වෙත් ද? යන සංශයාර්ථමය හැඟීම තරුණ සිත්හි ඇති වීම පුදුමයක් නො වේ.

අධිරාජ්‍යවාදී ස්වරූපය අවබෝධ කරගත නොහැකි, සිහින ලෝකයක සිරගත වූ තරුණ පරම්පරාවක ආරම්භය ද කවියා මෙමඟින් සංකේතවත් කළා විය යුතු ය. අධිරාජ්‍යවාදී මතවාදාත්මක යාන්ත්‍රණයට හසුවන නවකයන් මෙන් ම වැඩිහිටියන්ට ද තිබූ විකල්පය වූයේ සිංහරාජය වැනි සංවේදී වන අඩවියක් විනාශවන ආකාරය බලා සිටීම හා එමඟින් උත්පාදනය වන ආර්ථික අවස්ථාවන්ගේ කොටස්කරුවන් බවට පත්වීම යි.

පශ්චාත් කාලීන ව සිංහරාජ වැඩබිමේ ප්‍රධාන කම්කරුවන් බවට පත්වන්නේ ද වනාන්තරය ආශ්‍රිත ගම්මානවල විසූ ගැමියන් ය. ඔවුන් ද වෙළෙඳපළ සමාජයේ නව අවස්ථා කෙරෙහි ආසක්ත වූවා විය යුතු ය. එම අර්ථයෙන් කොඩිතුවක්කු කවියා මෙම පැදිපෙළෙන් මතුකරන ප්‍රධානතම ප්‍රවාදය වන්නේ සිංහරාජය වැනි ස්වභාවික සම්පත් නව අධිරාජ්‍යවාදයේ ග්‍රහණයට නතුවීමේ අර්බුදය යි. කවියෙකු වශයෙන් මෙම දේශපාලන ප්‍රවාදය ඔහු සෘජු ව පාඨකයා විෂයෙහි ඉදිරිපත් කර නැත. එහෙත් සිය වාමවාදී ආස්ථානයෙහි පිහිටා කොඩිතුවක්කු කවියා අවධාරණය කර ඇති ප්‍රවාදය වැදගත් වේ. එනම් 80 දශකයේ සම්ප්‍රාප්තියත් සමඟ වෙළෙඳපළ

අධිකාරයේ මතුවීම හා බල විරහිත රටවල ස්වභාවික සම්පත් කුඨ අන්දමින් අධිරාජ්‍යවාදීන් විසින් අත්පත්කරගනු ලැබීම යි.

කාන්තාර ගමක උපත

ග්‍රාමීය වනාන්තර කාන්තාර බවට පරිවර්තනය කිරීමේ අර්බුදය

වනහරණ කතිකාවෙහි පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ ප්‍රධාන කාව්‍යානුභූතිය වූයේ සිංහරාජ වන රක්ෂිතය යි. ඊට සමාන අත්දැකීමක් නන්දන වීරසිංහ කවියා ද සිය කාන්තාර ගමක උපත පැදිපෙළ මඟින් පාඨකාවතීර්ණ කර තිබේ. එනම් වීරසිංහ කවියා සිය වස්තු විෂය බවට පත් කරගෙන ඇත්තේ තමා ද කුඩා කල හැදී වැඩුණු ගොඩේකන්ද රක්ෂිතය යි.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙම පන් පැදුරට උණු කදුළක් හැලුණේ
මූකලාන පස්වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයෙකු වගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම්දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක්ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගේ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන් ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(වීරසිංහ, 1984: 40)

ගොඩේකන්ද වනාන්තර ප්‍රදේශය සිංහරාජ කලාපයට ම අයත් සංවේදී පරිසර කලාපයකි. එය වන සොරුන්ගේ ග්‍රහණයට නතු ව ඇති අතර ජාවාරම සිදු වන්නේ රාත්‍රියේ දී ය. රක්ෂිතය පාමුල ජීවත් වන කථකයාට රාත්‍රියෙහි සිදු වන මෙම වන සංහාරය ශ්‍රවණය වේ. ගොඩේකන්ද මූකලානත් ගැමි කථකයාත් අතර ඇත්තේ හුදු භෞතික බැඳීමක් නොවන ආධ්‍යාත්මික බැඳීමකි. රාත්‍රියෙහි කපා බිම හෙළන මහා රුස්ස ශාක ඔහුට සමීප මිතුරන් මෙනි. 'රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ' යන පේළියෙන් එය ගම්‍ය වේ. වනය ආශ්‍රිත ව සිය ජීවිකාව පවත්වාගෙන ගිය ද අසරණ ගැමියෝ එය පටු ලාභ ලැබීමේ අරමුණෙහි පිහිටා භාවිත නො කළහ. ගැමියන් විසින් කටයුතු කරන ලද්දේ වනාන්තර පද්ධතිය කෙරෙහි පවත්නා ගුඪ භක්තීමය හැඟීමකින් යුතු ව ය. නොඑසේනම් ගැමි කථකයා මේ මොහොතේ වනය පාමුල පැල් ගෙයක නොව සුඛෝපභෝගි මන්දිරයක වාසය කළ යුතු ව තිබිණි.

ගැමි කථකයාත් නොදැනීම දැස් උණු කඳුළෙන් බරිත වූ බව දැක්වීමෙන් වනය අහිමි වීමත් සමඟ පැන නඟින්නා වූ ආධ්‍යාත්මික විලාපය සංකේතවත් කර ඇත. මෙලෙස අනුක්‍රමික ව සිදු වන වන සංහාරය හේතුවෙන් පරිසරයේ පවත්නා සදාහරිත ගුණය ක්ෂය ව ගොස් ගම්මාන පද්ධතිය කාන්තරයක් බවට පත්වීමේ අවධානම පැදි පෙළෙහි අවධාරණය කර තිබේ. කෙසේ වුව ද ග්‍රාමීය වනාන්තර කලාපය සීමාවීම හෙවත් කාන්තාරකරණය මේ වනවිටත් ආරම්භ වී ඇත. කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ යනුවෙන් අප කවියා දක්වා ඇත්තේ එය යි.

එම අර්ථයෙන් 'කාන්තාර ගමක උපත' උපත පැදිපෙළෙන් නන්දන වීරසිංහ කවියා පාඨකාවතීර්ණ කර ඇති කාව්‍ය ආඛ්‍යානය වන්නේ අනීතික ආකාරයට සිදු වන වනහරණය යි. වර්තමානයේ දේශපාලන අනුග්‍රහයෙන් සිදුවන කැලෑකැපීම් යනු විස්මය දනවන මාතෘකා නො වේ. ඒවා බොහෝවිට සිදු වන්නේ පවත්නා නීතිවලට පටහැනි ආකාරයට ය. වනහරණයට එරෙහි

පෘථුල සමාජ විරෝධයක් නොනැගෙන ආකාරයට එය දෛනික ජීවිතයේ සාමාන්‍ය පුවතක් වී තිබේ.

පරාක්‍රම කොඩිතුවක්කු කවියා සිංහරාජ වනහරණයේ ප්‍රධාන වගකීම සුදු මහත්වරුන් හෙවත් අධිරාජ්‍යවාදීන් විෂයෙහි පවරා ඇත. එහෙත් නන්දන වීරසිංහ කවියා ගොඩේකන්ද රක්ෂිතයේ චූදිතයන් සිය පැදිපෙළ මඟින් ඍජු ව අවධාරණය කර නැත. එහෙත් පූර්විකාමය සාකච්ඡාවේ අවධාරණය කර ඇති පරිදි මෙම වන ජාවාරම්කරුවෝ නිදහස් ආර්ථිකයෙන් ඔද වැඩුණු නව සමාජ කණ්ඩායම් වෙති. සිංහරාජය සුදු මහතුන්ගේ අඩවියක් බවට පත් ව එය විනාශ කරනු දකින ගැමියන්ට ඇති වන්නේ සන්තාපයක් නොව පෙර සඳහන් පරිදි විස්මයකි. එහෙත් ගොඩේකන්ද තම එක ම ජීවන අවකාශය ලෙස හඳුනාගත් රක්ෂිතය පාමුල පැලක විසූ ගැමියාට ඇතිවන්නේ සන්තාපයකි.

වනහරණය හමුවේ නීතියේ ආධිපත්‍ය බිඳවැටීම

80 දශකයේ පළ වූ බොහෝ සාහිත්‍ය නිර්මාණ විරෝධාත්මක හෙවත් පවත්නා සමාජ ක්‍රමය විවේචනාත්මක අක්ෂයක පිහිටා විවරණය කළ නිර්මාණ විය. පවත්නා දේශපාලන තන්ත්‍රය ප්‍රශ්න කිරීමෙන් නොනැවතී ධනේශ්වර නීතියෙහි පවත්නා අසංවිධිතභාවය ද එහි ලා විචාරයට නතු විය. එම නිර්මාණ බහුතරයක් වාමවාදයේ ආභාසයට නතු වූ නිර්මාණ ලෙස හඳුනාගත හැකි ය (සුරවීර, 2013).

‘කාන්තාර ගමක උපත’ පැදි පෙළ ඍජු ව ම මාක්ස්වාදී පාරිසරිකවාදයේ ස්ථානගත කිරීමට තරම් උත්සුක විය යුතු නොවේ. එහෙත් එහි යම් වාමවාදී ආභාසයක් ගැබ් ව ඇති ආකාරය හඳුනාගත හැකි ය. රාත්‍රියෙහි කපා බිම හෙළන මහා වනස්පතීන් දැව බවට පත්කොට රැගෙන යන්නේ දිවා කාලයේ ලොරි මඟිනි. මෙලෙස සියලු දෙනාට ම පෙනෙන පරිදි අනීතික ව දැව ජාවාරම් කළ හැක්කේ කාට ද? එය ගැමි කථිකයා වැනි ආන්තික ගැමියන්ට කළ නොහැකි දෙයකි. එසේ කිරීමට හෝ සිතීමට තරම් ආර්ථික ප්‍රාග්ධනයක් ගැමියා සතු නොවේ.

පිරුණු ලොරිය ගම්දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක්ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

(වීරසිංහ, 1984: 40)

එවැනි බලයක් ඇත්තේ දේශපාලන අනුග්‍රහය හිමි ව්‍යාපාරික පැළැන්තියට පමණි. මෙම ව්‍යාපාරික පැළැන්තිය යනු කවරහු ද? ඔවුහු වැවිලි ආර්ථිකයෙන් පෝෂිත සාම්ප්‍රදායික ප්‍රභූ කණ්ඩායම් නොවේ. නොඑසේ නම් යටත්විජිත අධ්‍යාපන වරප්‍රසාද හමුවේ ඉංග්‍රීසිය උගත් නූතන ප්‍රභූ කණ්ඩායම් ද නොවේ. නන්දන වීරසිංහ මෙහි ලා ව්‍යංග්‍යයෙන් මතු කර ඇත්තේ 1977 විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණ මඟින් ඇතිකෙරුණු සමාජ අවකාශ ඔස්සේ බිහි වූ ව්‍යාපාරික ස්ථරය යි. ආර්ථික ප්‍රාග්ධනයට පරිබාහිර ඉහළ දේශපාලන අනුග්‍රහයක් සහිත වීම මෙම ව්‍යාපාරික ස්ථරයේ ලක්ෂණ වේ. ඔවිහු නියෝජනය කෙරෙන ආර්ථික හා දේශපාලන භූමිකා අතර ඇත්තේ මනා අනුකලනයකි. දේශපාලන බලාධිකාරය අඛණ්ඩ ව පවත්වාගැනීමෙහි ලා ආර්ථික ප්‍රාග්ධනය පැවතිය යුතු ය. ස්වභාවික සම්පත් දැඩි පාලනයකට නතු කරමින් අනීතික ව ඒවා සූරාකෑමට යොමුවන්නේ පවත්නා දේශපාලන බලය ආධාර කර ගනිමිනි (Amarasuriya, 2016: 06-16).

එබැවින් බල විරහිත ගැමියන්ට මෙම නව සමාජ බලවේගය යටපත් කිරීම පහසු කාර්යයක් නොවේ. කවියේ සඳහන් ව ඇති ආකාරයට දැවවලින් සන්නද්ධ ලොරිය ගම්දොරකඩ පසු කර යයි. මෙසේ යන මාර්ගය දෙපස කෙතරම් නම් පොලිස්

බාධක තිබිය යුතු ද? වන අඩවි නිලධාරි කාර්යාල පිහිටා තිබිය යුතු ද? නීතියේ යුක්තිය පසිඳලිය යුතු එම ආයතන නිද්‍රාශීලීත්වයේ පසුවන බව කවියා අවධාරණය කරයි. කරුණු එසේ නම් පෙර සඳහන් පරිදි ගැමියන්ට එකිනෙකාගෙන් ආන්තික හුදෙකලා අරගල මතින් මෙම කුඨ ව්‍යාපාරික පැළැන්තිය අතික්‍රමණය කළ නොහැකි ය. මන්ද නීතිය ද ධනේශ්වර ආර්ථික අධිකාරයේ ආධිපත්‍යයට නතු ව ඇති බැවිනි.

එහෙත් කඩාවැටීමට ආසන්න පැල නගාසිටුවීමෙහි ලා පරාල තුනක් කැපූ වරදට කථකයාගේ අයියාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වී ඇත. සිර මැදිරියේ අයියා හෙළන පීඩිත සුසුම ගැමි කථකයාට ඇති කරන්නේ ඉමහත් වේදනාවකි. නීති ඇත්තේ මහ වැරදිකරුවන්ට පලා යාමට හා කුඩා වැරදිකරුවන් අල්ලාගැනීමට නො වේ. නීතියේ සර්වසම මූලධර්මය වෙළෙඳපොළ සමාජය විසින් ගිලගෙන ඇති බව කවියා මින් අවධාරණය කරයි.

ජීවත්වීම සඳහා පරිසරය තිරසරාත්මක ව යොදාගැනීම හා අධිපරිභෝජනය සඳහා පාරිසරික සම්පත් විනාශ කිරීම යනු දෙකකි. අයියා පරාල තුනක් වනයෙන් සපයාගෙන ඇත්තේ සිය කඩාවැටීමට ආසන්න පැල්ගෙය යළි නගාසිටුවීම සඳහා ය. ව්‍යාපාරික පැළැන්තිය ඇතුළු වන චෞරයන් වනය සිදිනුයේ ලාභාපේක්ෂාවෙනි. ඔවුහු තාවකාලික සුඛය මිස අනාගත අවධානම ගැන නොසිතති.

ව්‍යාපාරික පැළැන්තියේ වනහරණ ක්‍රියාකාරකම් හේතුවෙන් පීඩාවට පත්වන්නේ අසරණ ගැමියන් ම ය. කවියා පවසන්නේ මෙය සියතින් තම මරණය සාක්ෂාත් කරගැනීමක් බව යි. එනම් තාවකාලික සුඛය වන්නේල වනය විනාශකොට දැව බවට පත් කිරීමෙන් ලබන ආදායම යි. එහෙත් දීර්ඝකාලීන අර්බුදය වන්නේ වනාන්තරය ආශ්‍රිත සමස්ත පරිසර පද්ධතිය වියැකි යාම යි. මෙමඟින් සංවේදී ජල මූලාශ්‍රය සිඳී යනු ඇත. දුර්ලභ ශාක විනාශ වනු ඇත. ජලය අහිමිවීමෙන් වනගත ගම්මානයේ සංස්කෘතික පැවැත්ම සහමුලින් ම තර්ජනයට ලක්වනු ඇත. කාන්තාරමය ගමක් බවට පත්වීමෙන් ගම්වැසියන්ට ජලය සොයා අවශේෂ ග්‍රාම කරා සංක්‍රමණය වීමට සිදුවනු ඇත. එබැවින් කවියා අවධාරණය කරන ආකාරයට වනහරණ ක්‍රියාවලියෙන් ඇතිකෙරෙන ප්‍රතිවිපාක එක හා සමාන නො වේ. එය කුට වන ජාවාරම්කාර ව්‍යාපාරික පැළැන්තියටත්, ගැමියන්ටත් බලපාන්නේ දෙයාකාරයට ය.

ඒ අනුව කවියා ධනේශ්වර නීතියෙහි ඇති ඒනතා සම්බන්ධයෙන් සිය විරෝධාකල්ප කවියට නඟා ඇත්තේ මෙසේ ය. එහෙත් එය තියුණු වාමවාදී විරෝධාකල්පයක් ද නො වේ. එය ග්‍රාම්‍ය චින්තනයෙන් පෝෂණය වූවකි. එබැවින් මෙහි ලා එළැඹීය හැකි නිරීක්ෂණාත්මක අදහස වන්නේ ජනකවියෙහි ආභාසය කවියා සිය දෘෂ්ටිවාදී ආස්ථානය බවට පත්කරගෙන ඇති බව යි.

අලුත් පාර මට හීනෙන් පෙනෙන්නේ

මාර්ග සංවර්ධන කතිකාව

සංවර්ධනය හා පරිසරය අතර ඇත්තේ ද්වන්දාත්මක සම්බන්ධතාවකි. සංවර්ධන අවශ්‍යතා ඉටුකරගැනීමට යෑමේ දී ස්වභාවික සම්පත් හායනය වීම බහුල ව සිදු වේ. නොඑසේ නම් පූර්වයේ සාකච්ඡා කළ ආකාරයට සංවර්ධනයේ නාමයෙන් වෙළෙඳපොළ අවශ්‍යතා උදෙසා ස්වභාවික සම්පත් නිර්දය ලෙස සූරාකෑම හඳුනාගත හැකි ය. එහෙත් මානව අවශ්‍යතා සංතෘප්ත වන ආකාරයට ස්වභාවික සම්පත් පරිභෝජනය පිළිබඳ සාකච්ඡා ව මතු වන්නේ ද 1970-80 කාල පරාසයේ දී ය (Athukorala & Rajapathirana, 2000).

පරාක්‍රම කොඩිතුවක්කු කවියා 'අලුත් පාර මට හීනෙන් පෙනෙන්නේ' කවි පෙළින්

අවධාරණය කර ඇත්තේ ද එම සමාජීය අවශ්‍යතාව යි. එහෙත් තමාට අනන්‍ය මාක්ස්වාදී භාවිතාව යටතේ එය ඉදිරිපත් කිරීමට ඔහු යත්න දරා ඇති බව පෙනේ. සිංහරාජය වැනි අතිසංවේදී පරිසර කලාපයක් නව යටත්විජිතවාදයේ අණසකට නතුවීම කොඩිතුවක්කු කවියා අවධාරණය කළ ප්‍රථම සංරචකය විය. 'සිංහරාජ වැඩපළ ගැන පෙත්සමක්' කාව්‍ය යටතේ ඉහත විමර්ශනය කරන ලද්දේ එය යි. එහෙත් සිංහරාජය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය නො හොත් සිංහරාජ ගම්මාන පද්ධතිය නවීකරණය වීමේ වැදගත්කම ද කවියා මෙලෙස අවධාරණය කර ඇත.

'කළුගල් තලාලයි පාරට දමන්නේ
එම ගල් පෑගිලයි සපත්තු
ගෙවන්නේ

සිංහරාජයට මග එළි *කරන්නේ*
සමාජවාදයේ කන්දයි *නගින්නේ*
වල් අලි වගේ ඩෝසර් වැඩ *කරන්නේ*
යකඩ දළේ ආවේසෙන් *අනින්නේ*
කන්ද හෙල්ලිලා දණ බිම *ගහන්නේ*
පසේ නැවුම් පුසුඹට හිත *පිරෙන්නේ*
කසා වරුණ වාහන දුව *පනින්නේ*
ජීප් ඇඬින් කන් දොරගුළු *වැටෙන්නේ*

දූලිදුමාරෙට ඇස් ලොඩි *කෙවෙන්නේ*
අලුත් පාර මට හිනෙන් *පෙනෙන්නේ*
දෙනෝ දහස් පාරේ වැඩ *කරන්නේ*
පොඩි අයියටත් අදනේ වැඩ *ලැබෙන්නේ*

හීන් අතට සුදු රුපියල් *වැටෙන්නේ*
අනේ වාසනා පාරට *වදින්නේ*
යකඩ ඇතා වටකරගෙන *ළමුන්නේ*
බීන සිතින් ඇයි කට ඇර *බලන්නේ*

අනාගතේටයි ඔය මග *වැටෙන්නේ*
පුංචි පයින් නුඹලයි දිග *මනින්නේ*
නැන්දගෙ ගෙදර පඩි පාරට *බිඳෙන්නේ*
මන්ද එයට වස් යාදිනි *කියන්නේ*

සින්ද කඳුළු මතු මග දිග *දිලෙන්නේ*
යන්ඩ කළාලය පුතුටයි *එළන්නේ*
රබර් තේ පඳුරු පාරට *කැපෙන්නේ*
මහත්මයා ඒ ගැන ඇයි *හැපෙන්නේ?*

යන්ඩ කළාලය පුතුටයි *එළන්නේ*
අනාගතේටයි ඔය මග *හදන්නේ*
කොළඹ මහත්තය ට්‍රැක්ටරේ *සිටින්නේ*
නළල් වටින් දාඩිය *වැටෙන්නේ*

ගමේ ළඳුන් නෙත් හී සැර *යවන්නේ*
ළඳේ නුඹ කැන්ද යන මග *හදන්නේ*
අලුත් පාර හඳ වැස්සට *තෙමෙන්නේ*
දොරවල් දෙකේ බස් එක අර *දුවන්නේ*

අඳුර කපා සවණක් රැස් *වැටෙන්නේ*
අනේ වාසනා පාරට *වදින්නේ*
(කොඩිතුවක්කු, 1973: 84).

ඒ අනුව කාව්‍යයෙහි අත්දැකීම වී ඇත්තේ සිංහරාජය ආශ්‍රිත මාර්ගයක් ඉදිකිරීම යි. දීර්ඝකාලයක් මුළුල්ලේ වනගත කෙටි මාවත් ඔස්සේ ගමන් කළ ගැමියන්ට දැන් ඒ පිළිබඳ තව දුරටත් කම්පා විය යුතු නැත. මන්ද විශාල ශ්‍රම දායකත්වයක් මධ්‍යයේ මෙම මාවත ඉදි කෙරේ. මානව සංවර්ධනයෙන් තොර ස්වභාවික සම්පත් සංරක්ෂණය ඵලදායි ක්‍රියාමාර්ගයක් නො වේ. එලෙස ම ස්වභාවික සම්පත් මනා ලෙස පාලනය කිරීමෙන් තොර මානව සංවර්ධනය ද ඵල රහිත වේ. එබැවින් මෙම බලවේග ද්විත්වය එක ම තලයක බහා සාකච්ඡා කිරීම පහසු නැත. සිදු විය යුත්තේ අවස්ථානුකූල සමබරතාවක් පවත්වාගැනීම යි.

1977 විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණයෙන් ප්‍රධාන අවධානය ලබාදුන් ක්ෂේත්‍රයක් වූයේ

යටිතල පහසුකම් සංවර්ධනය යි. එයිනුදු මාර්ග සංවර්ධනය වැදගත් වේ. ගෝලිය ප්‍රාග්ධනය හා නවලිබරල් ඇවතුම් පැවතුම් ඈත ග්‍රාමීය කලාප දක්වා විසරණය විය යුතු ය (Athukorala & Rajapathirana, 2000). එසේ වීමට සියලු කලාප ආවරණය කෙරෙන මාර්ග පද්ධතියක් අවශ්‍යය වේ. සිංහරාජ වන ග්‍රාමයන් තව දුරටත් ආන්තික ග්‍රාමයන් බවට පත් නො වේ. අප කැමති වුව ද අකමැති වුව ද නව ලිබරල් ප්‍රාග්ධනයේ ස්වරූපය එය යි.

සිංහරාජය වැනි අතිසංවේදී වන කලාපයක් ක්‍රමික ව වාණිජකරණය වීම පිළිබඳ සංවේදිතාවක් පරාක්‍රම කොඩිතුවක්කු කවියාට ඇත. එහෙත් ඔහු සිය පැදිපෙළ රචනා කර ඇත්තේ අනාගතය පිළිබඳ ධනාත්මක දෘෂ්ටියක පිහිටා ය. සිංහරාජ ග්‍රාමය දැන් එක ම වැඩබිමකි. ශ්‍රමිකයෝ පරිබාහිර අය නොවන ගමේ ම අය වෙති. කථකයාගේ පොඩි අයියා ද මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ කම්කරුවකු වී ඇත. එය ගැමියන් හා වනාන්තරය අතර පැවති සම්බන්ධතාව නවීකරණය වීම පිළිබඳ සංකේතයකි.

කවියා ඉමහත් අභිරුචියෙන් අවධාරණය කර ඇති ආකාරයට මෙලෙස ඉදිවන මාර්ගය අනාගත පරපුර සඳහා ය. අද එහි ගැවසෙන, නිරීක්ෂණය කරන බාල පරම්පරාව එය අනාගතයේ පරිභෝජනය කරනු දැකීම කවියාගේ පරමාර්ථය යි.

මාර්ග සංවර්ධනය හා නව සමාජ සම්බන්ධතා ඇතිවීම

ප්‍රස්තුත කවි පන්තිය පාරිසරික විචාරවාදී න්‍යායේ වැදගත් න්‍යායික කලාප ද්විත්වයක් ස්පර්ශ කර ඇත. එහි පළමු කලාපය නොඑසේ නම් සංකල්පය වන්නේ තිරසර සංවර්ධනය යි. තිරසර සංවර්ධනය නොඑසේ නම් ධරණීය සංවර්ධන කතිකාව ගෝලිය ව ඉදිරිපත් වන්නේ 1970-1980 දශකයේ දී පමණ ය. ඉන් සරල ව අදහස් වන්නේ, අනාගත පරපුරේ අවශ්‍යතා ද සංතෘප්ත වන ආකාරයට ස්වභාවික සම්පත් අනුසාරයෙන් සංවර්ධනය අත්පත් කරගැනීම යි (Krantz, 2001).

'අලුත් පාර මට හීනෙන් පෙනෙන්නේ' කවි පන්තිය තිරසර සංවර්ධනය විද්‍යමාන කෙරෙන පබැඳුමක් නො වේ. එහෙත් එහි තිරසර සංවර්ධන ප්‍රවාදයේ ජීව ගුණාංග කිහිපයක් හඳුනාගත හැකි ය. එනම් අනාගතවාදී දෘෂ්ටිය එහි පළමු සංලක්ෂය යි. කවියාගේ මානවවාදීත්වය ද එහි ලා ගැබ් ව තිබේ. පූර්වයේ විමර්ශනය කළ ආකාරයට මෙම නව මාර්ගය අනාගත පරපුර පරිභෝජනය කරනු දැකීම කවියාගේ පැතුම යි.

දෙවනුව සිංහරාජය තව දුරටත් ආන්තික වන කලාපයක් බවට පත් නොකොට එහි ස්වභාවික සම්පත් ඵලදායි සංවර්ධනයක් සඳහා ආයෝජනය කිරීම යි. කපාහෙළන ගස්, බිම හෙළන කඳු වැටි මාර්ග සංවර්ධනය සඳහා ය. එය ජනතාවාදී සංවර්ධනයක් ද වේ. සිංහරාජ මාවත ඉදිවන්නේ ද එහි ම විසූ ගැමියන් අතිනි. එහි ලා කොළඹ සිට පැමිණි නාගරික කම්කරුවන්, ව්‍යාපාරික බලවතුන් හා ග්‍රාමීය ළමයින් යන ස්තර ගණනාවක් කවියා නිරූපණය කර ඇත.

කවි පන්තියේ අවධාරිත දෙවන න්‍යායික කලාපය වන්නේ ගොඩනැඟෙන නව සමාජ සම්බන්ධතා ජාලය යි. මාර්ගයක් ඉදිකිරීම යනු හුදෙක් භෞතික ක්‍රියාවලියක් පමණක් ම නො වේ.

''කොළඹ මහත්තය ට්‍රැක්ටරේ සිටින්නේ
නළල් වටින් දාඩිය වැටෙන්නේ
ගමේ ළඳුන් නෙත් හී සැර යවන්නේ
ළඳේ නුඹ කැන්ද යන මග හදන්නේ

අලුත් පාර හඳ වැස්සට තෙමෙන්නේ

දොරවල් දෙකේ බස් එක අර දුවන්නේ

අඳුර කපා සවණක් රැස් වැටෙන්නේ

අනේ වාසනා පාරට වඳින්නේ''

(කොඩිතුවක්කු, 1973: 84).

මෙම නව මාර්ගය ඉදිකිරීම සම්බන්ධ පොදු ඒකමතික භාවයක් ගැමියන් අතර ම නැත. නැන්දාගේ නිවසේ පඩි මාර්ග යට බිඳී යනවිටත්, මහත්මයාගේ රබර් තේ අස්වැන්න කැපී යන විටත් ඔවුන් මැසිවිලි නගනවා විය යුතු ය. එවැනි අවස්ථා කිහිපයක් හැරුණ විට කවියා මෙම සංවර්ධන ව්‍යාපෘතියේ ඇති සාධනීය බව සාකල්‍යවාදීව සිත යි. නව මාර්ගය ඔස්සේ ගැමියන්ගේ මෙන් ම නාගරිකයන්ගේ සමාජ සංචලතාව ඉහළ යනු ඇත. කොළඹ මහත්තයා හා ගමේ ළඳුන් අතර ඇතිවන ආලෝචන සංවාදය කවියා දකියි. එය නව සමාජ සම්බන්ධතා පිළිබඳ ඉඟියකි. එමෙන් ම මාර්ගය දෙපස විදුලි රැහැන් කණු ද ඉදිවෙමින් පවතින අතර එය අඳුර පහ කිරීමට සමත් වේ. මෙහි අඳුර යනු භෞතික අඳුර නො වේ. ගැමියන්ගේ ජීවිත වසා සිටින අඳුර යි. නුදුරු අනාගතයේ මාර්ග යේ බස් ධාවනය ද සිදු වන අතර කවියා ඇතුළු ඉබොහෝ ගැමියෝ එය වාසනාවක් ලෙස දකිමින් ගොඩනැඟෙන මාවතට වන්දනාමාන කරති.

එබැවින් පරාක්‍රම කොඩිතුවක්කු කවියා සිංහරාජ වනසංහාරය කවියට නැඟීම හා සමගාමී ව මාර්ග සංවර්ධනය වැනි යටිතල පහසුකම් සංවර්ධනයේ අවශ්‍යතාවාදය ද කවියෙන් මතුකර ඇත. 80 දශකය ගෙවී සැලකිය යුතු කාලසීමාවක් ගත ව ඇතත් කොඩිතුවක්කු කවියා සුබවාදීව අපේක්ෂා කළ සංවර්ධන ප්‍රතිලාභ ගැමියන් අතර සාධාරණ ව බෙදී ගොස් තිබේ ද? යන්න මෙහි ලා පසු සාකච්ඡාවට ලක්කළ යුතු පැනයකි. සැබැවින් ම සිංහරාජය වැනි ස්වභාවික වනාන්තර කලාප දෙනික ව සංවර්ධනයේ නාමකරණයට ආවරණය වී සූරාකෑමට ලක්කෙරෙන ආකාරය මනාව නිරීක්ෂණය කළ හැකි ය.

වනහරණය සහ ග්‍රාම සංවර්ධන තේමාව පමණක් නොව මෙම කවීන් ද්විත්වය ස්වභාවික සම්පත් හා දේශීය කර්මාන්ත වෙළෙඳපොළකරණය වීම සම්බන්ධයෙන් ද අදහස් දක්වා ඇති ආකාරය විමසා බලමු.

3.2 ස්වභාවික සම්පත් වෙළෙඳපොළකරණය වීම

1980 දශකයේ දී වනහරණය හා ග්‍රාම සංවර්ධනය ප්‍රධාන පාරිසරික තේමාවක් වූයේ යම්සේ ද, එලෙස ම ජල අයිතිය සූරාකෑම නොහොත් ජලය මුල් වූ ගැටුම් කවියට නැඟූ අවස්ථා ඉබොහෝ හමු වේ. මෙම සන්දර්භයෙහි පිහිටා පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ 'වතුර එක්ක යෑම' හා නන්දන වීරසිංහ කවියාගේ 'කොලණියේ අවනඩුව' යන පද්‍ය නිර්මාණ විමර්ශනය කර ඇත.

ජල අයිතිය සූරාකෑමේ අර්බුදය

වතුර එක්ක යෑම

ග්‍රාමීය සමාජ පිළිබඳ ව ලියැවී ඇති සෞන්දර්ය විග්‍රහය මඟින් සිදුවන්නේ සැබෑලෙස ම සාකච්ඡාවට ලක්විය යුතු තථ්‍ය අත්දැකීම් යටපත් වීම යි. එහෙත් මානව හා සමාජ විද්‍යාත්මක මැදිහත්වීම් යටතේ ග්‍රාමීය සමාජ පර්යේෂණයට ලක් ව ඇති අතර සෞන්දර්යවාදයට යටපත්ව ඇති විෂමතා සමුදායක් ඉන් විවරණය කෙරී තිබේ (වෙල්ගම සහ ගලගමගේ, 2021). පර්යේෂණ අර්ථකථනවලට නො දෙවෙනි ආකාරයට පරාක්‍රම කොඩිතුවක්කු වැනි වාමවාදී කවීහු ද ගැමියන් මුහුණදෙන ගැටුම් භාවාත්මක ලෙස කවියට නැඟූහ.

වතුර එක්ක යෑම' ග්‍රාමීය ජල අයිතීන් නිර්දය ලෙස සූරාකෑම හා ඊට එරෙහි ව ගැමියන්

සිය ආවේගාත්මක විරෝධය ප්‍රකාශ කළ ආකාරය නිරූපිත කවි පන්තියකි.

''මහත්මයා,
සමාවෙලා මේ අහන්න
වැරැද්ද කළේ අපියි,
99 වේල්ලේ
දිය අගුල කැඩුවේ අපි
එහෙම කළේ
උණ වසන්ගතේ වැදුන පැටියෙක් වාගෙ
අපේ කුඹුර මැරී යනව
බලා ඉන්ඩ බැරි සන්දා
ඉංජිනේරු මහත්මයා මායිම් වෙනස් කළා
අලුත් වේල්ලේ වතුර පාරමුදලාලිගේ යාය උඩින් අරං ගියා
අපේ විරුද්දෙට පිටුපා.
අපේ කුඹුරු පාළු උනා කටට වතුර පොදක් නැතුව,
අස්වැන්නක් නැති හන්දා සමහර අයවගා ණයෙන් බේරෙන්නට
ගිනි තියලා ගොයම් ලියදි පිලිස්සුවා බලා ඉන්ඩ බැරිම වෙලේ
වියැට ගෙඩියක් ගන්න වේල්ලේ දිය අගල කැඩුවා අපි
පාඩමක් උගන්වන්ඩ එදා අපට බයිසිකලෙන් නියර උඩට ඔබ ඇවිදින්
ගිරි පුප්පා කෑ ගහලා අපට තහනම් කෙරුවා
අලුත් වතුර පාර
මහත්මයා, සමාවෙලා මේ අහන්ඩ සත්තු වගේ මඩ කාගෙන
වේල්ල කැපුවේ අපි ලේ තලලා ඇඟිලි පැලී
ඇනිකට් එක බැන්දේ අපි මුදලාලිට වතුර ඩිංග හොරාගන්ඩ දෙන්ඩ එපා
අපේ ගෙවල් මාන කැලේ තව නෑ වහලක් තියලා
අපට දෙන්ඩ අපට අයිති වතුර පාර
මිදුලට වී පුංචි එවුන් බලා ඉන්නේ
නාඹ තල් කඳ සමාන
වතුර පාර එක්ක යන්ඩ''
(කොඩිතුවක්කු, 1975: 188)

තරමක් දීර්ඝ පැදිපෙළක් වූ මෙම කාව්‍යය නිසඳැස් ආකෘතිය ඔස්සේ රචනා වූවකි. කුලය, ආගමික අනන්‍යතාව හා පාරිසරික බලවේග වැනි ඉපැරැණි සතුරන්ට පරිබාහිර ව සිය ජල අයිතිය සුරාකෑමට යත්න දරන සමාගම් හා ඒවායේ ව්‍යාපාරික පැළැන්තිය සමඟ සම්මුඛ වීමට ද ගැමියාට සිදු ව තිබේ. ඉපැරැණි සතුරන් නව ප්‍රතිගාමීත්වයේ කොටස්කරුවන් බවට පත් ව ඇති සේ ය. සිය පරම අයිතිය වූ ජල හිමිකම මුදලාලි නොඑසේ නම් බහුජාතික සමාගම්හි ග්‍රාමීය නියෝජිතයෝ සූරාකති. ගැමියාට ඔවුන් සමඟ පෞද්ගලික අමනාපයක් නැත. ඔවුහු වේල්ල කැඩීමේ දෝෂය නිර්භය ව හෙළිකරමින් සාධාරණත්වය අපේක්ෂා කරන්නේ එබැවිනි.

මෙම පැදිපෙළ යම් ආකාරයක කාව්‍යමය පාපෝච්චාරණයක් බඳු ය. එමෙන් ම එය කාව්‍යමය විලාපයක් ලෙස ද හඳුන්වා දීමෙහි වරදක් නැත. එබැවින් කොඩිතුවක්කු කවියාගේ වතුර එක්ක යෑම පැදිපෙළ ගොවියන්ගේ ජල අයිතිය උල්ලංඝනය වීම සහ ඊට එරෙහි ව ඇතිවන ගැටුම් සිය කාව්‍යය ආඛ්‍යානය බවට පත්කරගත් නිර්මාණයකි.

වතුර එක්ක යෑම පැදිපෙළෙහි අඩංගු පන්ති ප්‍රතිරෝධිතා

පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ 'වතුර එක්ක යෑම' නමැති මෙම කවි පන්තිය ද සුවිශේෂ වන්නේ එය ගොවි අරගලයක් අත්දැකීම බවට පත්කරගත් නිර්මාණයක් වන හෙයිනි. එහෙත් කවියා එහි පවත්නා

පන්ති ප්‍රතිරෝධතාවය සෘජු ව ප්‍රකාශ කර නැති නමුදු පැදිපෙළ විශ්ලේෂණය කිරීමේ දී එහි කියවෙන පන්ති ආස්ථාන ද්විත්වය හඳුනාගැනීම අපහසු නැත. මුදලාලි පැළැන්තිය මඟින් ග්‍රාමීය ප්‍රභූ පන්තිය හෙවත් බහුජාතික සමාගම්හි දේශීය නියෝජිතයන් සංකේතවත් කෙරෙන අතර එහි අනෙක් අන්තය වන්නේ ගොවි කම්කරු පන්තිය යි (Amarasuriya, 2016: 06-16).

ගොවි කම්කරුවන් විසින් නිෂ්පාදනය කෙරෙන බහුතරය හෙවත් කෘෂි අතිරික්තය නිර්දය අන්දමින් මුදලාලි පැළැන්තිය සූරාකති. ගැමියන් වගා කිරීමට අවශ්‍ය ණය ලබාගන්නේ ද මෙම ව්‍යාපාරිකයන්ගෙනි. එබැවින් ගැමියෝ ආකාර ද්විත්වයකින් සූරාකෑමට ලක් වෙති. පළමු ව තමා වගාකරන නිෂ්පාදනයෙන් සූරාකෑම යි. තමා උපයන අස්වැන්න නිවසේ සියලු දෙනාට ම ප්‍රමාණවත් නො වේ. එය කුඩා දරුවන්ගේ කුස පිරවීමට සමත් විය හැකි ය. එබැවින් නැවත ණය හිමියන් වෙත දිව යෑමට සිදු වේ.

''අපේ කුඹුරු පාළු උනාකටට වතුර පොදක් නැතුව,

අස්වැන්නක් නැති හන්දා සමහර අයවගා ණයෙන් බේරෙන්නට

ගිනි තියලා ගොයම් ලියදි පිලිස්සුවා බලා ඉන්ඩ බැරිම වෙලේ''

(කොඩිතුවක්කු, 1975: 188)

දෙවන ආකාරය වන්නේ ජල අයිතිය වැනි ගැමියන්ට හිමිවිය යුතු මූලික අවශ්‍යතා සූරාකෑම යි. ගැමියන් අධික පරිශ්‍රමයකින් ඉදිකළ වේල්ලේ ජලය මුදලාලි අනුකම්පා විරහිත ව සූරාකයි. ගැමියෝ මුදලාලිවරුන් මෙන් සුඛෝපභෝගි ජීවිත ගත නො කරති. එමෙන් ම ඒ සමාන ජීවිතයක් ද ඔවුහු අපේක්ෂා නො කරති. ඔවුන් ඉල්ලා සිටියේ තමා ඇතුළු තම දූ දරුවන්ගේ ද අවශ්‍යතා සංතෘප්ත වන ජල අයිතිය පමණි. පරාක්‍රම කොඩිතුවක්කු කවියා ජල අයිතිය උල්ලංඝනය වීම පෙරටුකරගත් පන්ති විෂමතාව අවධාරණය කිරීමෙන් නොනැවති පන්ති ප්‍රතිරෝධතා ද කවියට නඟා ඇත. ගැමියන් කටයුතු කරන ලද්දේ තමාට හිමිවිය යුතු ජල අයිතිය මුදලාලිට සොරාගැනීමට ඉඩ ලබා නොදිය යුතු ය, යන පොදු හැඟීමෙනි. එහෙත් ඉංජිනේරු මහතා වැනි ගමට පත් ව ආ උගතුන් ද මුදලාලිගේ ග්‍රහණයට නතු ව ඇති සේ ය. සිය ඉංජිනේරු බුද්ධිය මෙහෙයවමින් ඔහු වේල්ලේ ජලය මුදලාලිගේ වගාබිම් වෙත හරවා ඇත.

කරුණු මෙසේ වූ හෙයින් අසාධාරණයෙන් පරිපීඩිත ගැමියෝ තම ශ්‍රමයෙන් තැනූ වේල්ල කඩාදමමින් සිය ප්‍රතිරෝධය දැක්වීමට කටයුතු කළහ. අසාධාරණයෙන් පීඩිත ව සිටිනු වෙනුවට ඔවුහු සිය ආවේගය ක්‍රියාත්මක කර ඇත්තේ එලෙස ය. එබැවින් පීඩිතයාට ද හඬක් නොහොත් ආයුධයක් තිබේ. එය හුදු පහරදීමක් හෝ සන්නද්ධ අරගලයක් ම විය යුතු නැත. එහෙත් ගැමියෝ මෙම ගැටුමෙහි අඛණ්ඩතාවක් බලාපොරොත්තු නො වෙති. වේල්ල කැඩූ වරද නිසා ජල අර්බුදය තවත් උග්‍ර අතට පත් ව තිබේ.

කොලණියේ අවනඩුව

ජල හා ඉඩම් අයිතිය සූරාකෑමේ අර්බුදය

නන්දන වීරසිංහ කවියාගේ ''කොලණියේ අවනඩුව' නමැති කවි පන්තිය ද ග්‍රාමීය ජල අයිතීන් සූරාකෑම පිළිබඳ විවරණයකි. එමෙන් ම කෘෂි ඉඩම් අත්පත් කරගැනීම සඳහා කටයුතු කෙරෙන මහත්වරුන් හෙවත් ව්‍යාපාරික පැළැන්තිය ද කවියා මෙහි ලා අවධාරණය කර ඇත.

වැවේ වතුර උරා බීපු නියං යකා තරවී ඇත
කෙත්යායේ දණක් එරුණු මඩ රොල්ලම කර වී යත
ගමේ හුස්ම නැවති නැවති වැටෙනා හඬ සවන් වැදෙන
කවුදෝ අව සිහියෙන් ලන විලාපයක රාව නැගෙන

ඉහිලුම් නැති පිපාසයෙන් ගවරැළ වැව් පිටිය කොනේ
තියනා මර ළතෝනි හඬ ඇතින් එන සුළඟ ගෙනේ
බඩගින්න වියරු වෙසින් අතුණු බහන දවන තැනේ
මහත්තුරුන් අඩු කොළේට අපේ කුඹුරු සොයනු පෙනේ

වතුර නොලැබ අපේ කුඹුරු පාණ්ඩුවේ මියැදෙනව
ඒත් එහා පැත්තෙ යායේ කරලේ කිරි වැස්සෙනව
පරඬැල් වූ කොලණිය මැද උදර කුහර ගිනි ගන්නව
ඒ අතරේ කරල පැහී මහත්තුරුන් උඩ පනිනව

එදා බෝසතුන් පින් මහිමෙන් දිය උල්පත් ලැබුවට
අද දෙව්දත් ලා දෙසටම සොරොව්ව ඇරලා කදිමට
කොරෝදයක් නැති වුණාට හරිම වේගයකි හිත යට
ඉරු ඇඬුවත් වතුර හොරුන් හිනාවේවී අපේ දුකට

(වීරසිංහ, 1984: 26)

උග්‍ර නියං සමයකට මුහුණ පා සිටින පීඩිත ගැමියන්ගේ ශෝකාලාපය මෙම පැදිපෙළෙහි අනුභූතිය වී තිබේ. නියඟය ගැමියා ගත කරන කඨෝර ජීවිතයේ ම එක් කොටසකි. ගැමියෝ ජීවිතයත් මරණයත් අතර සටනකට මැදිව අහස දෙස බලා සුසුම්ලති. ඒ වැසි කාලයේ අපේක්ෂාවෙනි. ප්‍රමාණවත් ජල ධාරිතාවක් නොමැති වූ කල ඔවුහු කුඹුරු වගාව අත්හැර දමති. ජීවිතය කෙසේ හෝ ගැටගසාගෙන යනු පිණිස විවිධ ණය තුරුස්වලට ලක් වන ගැමියා ඉන් ඇතිවිය හැකි අනාගත අවදානම් ගැන නොසිතා තමා සන්තකයෙහි ඇති මඩ ඉඩම් විකුණා දමන්නේ ඉච්ඡාභංගත්වය ද මුසු වූ හැඟීමෙනි.

ගැමියාට කාෂ්ටක අව්වෙන් මැලවුණු සිය මඩ ඉඩම් අල්ප මාත්‍රයකුදු වටින්නේ නැති නමුදු බහුජාතික සමාගම් ඇතුළු ව්‍යාපාරික පැළැන්තියට එම ඉඩම් වටිනා ප්‍රාග්ධනයකි. ඔවුහු ඒවා ඉතා අඩු මුදලකට මිල දී ගනිති. නොඑසේ නම් නියං සමයේ ගැමියා විෂම ණය චක්‍රයකට සිරකොට එම ඉඩම් කුඨ ලෙස අත්පත් කරගනිති. මෙම කාව්‍යයෙහි එක් අන්තයකින් උග්‍ර පිපාසය හා කුසගින්නේ දැවෙන ගැමියා නිරූපණය කර ඇති අතර ම අනෙක් අන්තයෙන් අඩු ලංසුවට ඉඩම් හා ජල අයිතිය ගොදුරු කරගැනීමට මාන බලන ව්‍යාපාරික පැළැන්තිය කවියා මතු කර ඇත්තේ මෙසේ ය.

‘ගමේ හුස්ම නැවති නැවති වැටෙනා හඬ සවන් වැදෙන’

‘කවුදෝ අව සිහියෙන් ලන විලාපයක රාව නැගෙන ’

‘මහත්තුරුන් අඩු කොළේට අපේ කුඹුරු සොයනු පෙනේ’

(වීරසිංහ, 1984: 26)

ජලය යනු පොදු සම්පතකි. එය මිහිමත වසන මිනිසාට පමණ උරුම වූ ස්වභාවික සම්පතක් නො වේ. එහෙත් අප කවියා මතු කරන ආකාරයට මහත්වරුන් නොඑසේ නම් බහුජාතික සමාගම් සහ ඒවායේ ව්‍යාපාරික නියෝජිතවරු ගැමියාගේ ජල අයිතිය ද උදුරාගත්හ. එනම් ගමෙහි පොදු පරිභෝජනයට පැවති සොරොව්ව ව්‍යාපාරිකයෝ කුට ලෙස අත්පත් කරගත්හ. ඔවුහු සාතිශය බහුතරයක් වූ ගැමියන්ගේ ජල අයිතිය උල්ලංඝනය කරමින් සිය වාණිජ කෘෂිකර්මාන්තය සාර්ථකත් ව පවත්වා ගෙන යති. මෙය කවියා මතුකරන ආකාරයට ජල අයිතිය නිර්දය ලෙස සොරාකෑමකි. ඒ අනුව කොලණියේ අවනඩුව පැදිපෙළෙහි අන්තර්ගත ව ඇති පාරිසරික ආඛ්‍යානය මෙලෙස අවබෝධ කරගත හැකි ය. සිය ජල අයිතිය තම දෑස් මානයේ දී ම උල්ලංඝනය වනු දකින ආවේගශීලි ගැමි ස්ථරයක් පරාක්‍රම කොඩිතුවක්කු කවියා අත්දැකීම බවට පත්කරගත්ත ද නන්දන වීරසිංහ කවියා සිය අනුභූතිය බවට පත් කරගෙන ඇත්තේ සිය ආවේගය ගැටුමකට පරිවර්තනය කළ නොහැකි ඉවසා වදාරා සිටින ගැමි ස්ථරයකි.

ජල හා ඉඩම් අයිතිය සමාගම්කරණය වීමේ අවදානම

නාමික අර්ථයෙන් ජලය පොදු මිනිස්

පරිභෝජන අයිතිවාසිකමක් ලෙස හඳුනා ගනු ලැබුව ද ව්‍යවහාරික ව එය වෙළෙඳපළ සමාජය විසින් පාලනය කිරීම සිදු වේ. එනම් බහුජාතික සමාගම් විසින් ජල මූලාශ්‍රයය අත්පත් කරගැනීම හා ඒවා පාලනය කිරීම සම්බන්ධයෙන් යම් අධිකාරත්වයක් පවත්වාගෙන යනු ලබයි. කේවල ව ගත්කල මෙය ජලය වෙළෙඳපළකරණය වීම ලෙස අර්ථකථනය කළ හැකිමුත් එය හුදෙකලා පරිසර අර්බුදයක් නොවේ. එය බොහෝවිට ග්‍රාමීය කෘෂි ඉඩම් සමාගම්කරණය වීම යන සංසිද්ධිය සමඟ වෙළී පවති.

මෙම සමාගම් සහ ඒවායේ වෙළෙඳ නියෝජිතයෝ ගිජු ව ග්‍රාමීය කෘෂි ඉඩම් ගොදුරු කරගැනීමට කටයුතු කරති. ඔවුට්ට ඒ සඳහා අවශ්‍ය දේශපාලන හා ආර්ථික නිදහස 1977 ඇතිකරන ලද විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණ මඟින් හිමි විය. වර්තමානයේ ගොවි ඉඩම් අත්පත් කරගත් ඉහළ ප්‍රාග්ධනයේ හිමිකාරත්වයක් සහිත ව්‍යාපාරිකයන් පිළිබඳ කොතෙකුත් අසා ඇත්තෙමු. ගැමියන්ගේ ජීවිත මෙම බහුජාතික සමාගම් හා එහි ව්‍යාපාරිකයන්ගේ පාලනයට නතු ව ඇති ඇති අතර ක්ෂුද්‍ර මූල්‍ය ණය වැනි කුඨ උපායන් මඟින් පරම්පරා ගණනාවකට ගැමියන් ණයකරුවන් බවට පත්කර තිබේ (වෙල්ගම සහ ගලගමගේ, 2021).

‘කොලණියේ අවනඩුව’ පැදිපෙළ මඟින් පාඨකාවතීර්ණ කර ඇත්තේ වර්තමානයේ අතිශය සංකීර්ණත්වයට පත් ව ඇති එම අර්බුදය යි. මඩ ගොවිතැන හෙවත් දේශීය වී ගොවිතැන අඩපණ වීමේ සමාරම්භය සිදු වන්නේ 1980 දශකයේ දී පමණ වේ. ගැමියන්ගේ කුසගින්න තම එක ම පාලක මෙවලම බවට පත්කරගන්නා ව්‍යාපාරික බවලතුන් ඉඩම් හා ජල සම්පත් නිර්දය ලෙස සූරාකෑමට ලක්කරති.

බඩගින්න වියරු වෙසින් අතුණු බහන දවන තැනේ
මහත්තුරුන් අඩු කොළේට අපේ කුඹුරු සොයනු පෙනේ

(වීරසිංහ, 1984: 26)

යනුවෙන් කවියා අවධාරණය කර ඇත්තේ එය යි. ජලය ඇතුළු ස්වභාවික සම්පත් වෙළෙඳපොළකරණය වීම නූතන පාරිසරික විචාරවාදී න්‍යායෙහි කේන්ද්‍රීය තේමාවකි. එය ද තියුණු විචාරයට ලක්කර ඇත්තේ මාක්ස්වාදී පාරිසරිකවේදීන් විසිනි. ඉන්දියානු ජාතික වන්දනා ශිවා එහි ලා අපට හමුවන ප්‍රධාන පාරිසරිකවේදිනියකි. ඈ විසින් සම්පාදිත බොහෝ ලේඛනවල අන්තර්ගත ව ඇත්තේ ජලය කේන්ද්‍ර කරගත් ඉන්දීය ගොවි අරගල හා එහි ස්වරූපයන් ය (Shiva, 1998).

ප්‍රස්තුත ‘කොලණියේ අවනඩුව’ පැදිපෙළ විශ්ලේෂණය කරන කල්හි වන්දනා ශිවා වැනි ලේඛිකාවන්ගේ ආභාසය සෘජු ව හඳුනාගත නොහැකි නමුදු අප කවියා ද සිය විරෝධාකල්පය කවියට නඟා ඇත්තේ ගැමි විඥානය සිය කථන මාධ්‍ය බවට පත්කරගනිමිනි. ගැමියන් හා ව්‍යාපාරික පැළැන්තියේ ධ්‍රැවීගත වීම අප දකින්නේ උක්ත ගැමි දෘෂ්ටිකෝණයෙනි. එනම් තම වාණිජ අස්වැන්න සරුවීමෙන් ප්‍රහර්ෂයට පත්වන ව්‍යාපාරික ස්ථරය ඉහළ ධනපති සමාජය නියෝජනය කරන්නෝ වෙති. සුසුම්ලන, සිය සන්තාපය කඳුළු බවට පත් කිරීමට නොහැකි ආන්තික ගැමියන් නිර්ධන ස්ථරයට අයත් වෙති. ඔවුහු ගැමි සමාජයේ තව දුරටත් ආන්තිකරණය වූ පීඩිත කණ්ඩායම් වෙති.

එම අර්ථයෙන් ‘කොලණියේ අවනඩුව’ මෙලෙස විස්තෘත ව විශ්ලේෂණය කළ හැකි ය. නන්දන වීරසිංහයගේ කාව්‍ය නිර්මාණ තුළ ද නිශ්චිත වාමවාදී ආභාසයක් හඳුනාගත හැකි ය. එහෙත් එය ධනේශ්වර සමාජය හෝ එහි වෙළෙඳපළ බලවේග තියුණු විචාරයට ලක් කෙරෙන වාමවාදයක් නොවේ.

සමාලෝචනය

ලාංකේය නූතන සිංහල කවිය පෘථුල අවකාශයකි. එබැවින් නූතන සිංහල කවිය පාරිසරික විචාරවාදය වැනි නව විචාර ධාරා මඟින් ප්‍රතිකියවීමකට ලක් කිරීමට යත්න දැරිය යුතු ය. මෙම අධ්‍යයනය සන්දර්භගත වන්නේ එම ඓතිහාසික වූත්, සමාජීය අවශ්‍යතාව යම් පමණකින් හෝ ආමන්ත්‍රණය කිරීමට ගත් එක් මැදිහත්වීමක් වශයෙනි. එබැවින් මෙම අධ්‍යයනය පරිපූර්ණ අධ්‍යයනයකි යන අදහසෙහි පිහිටා කටයුතු කළ යුතු නො වේ. මෙහි ලා පාදක වී ඇත්තේ 80 දශකය යි. එයිනුදු එම අවධිය නියෝජනය කළ පරාක්‍රම කොඩිතුවක්කු හා නන්දන වීරසිංහ යන කවීන් හා එම කවීන්ගේ ද පරිසර අනුභූතීන් පාදක වූ සීමිත පද්‍ය නිර්මාණ කිහිපයක් උපයෝගී කරගෙන තිබේ. මෙම ප්‍රයත්නය මඟින් 80 දශකයේ සිංහල කවියේ පාරිසරික විචාරවාදී අවකාශ සම්බන්ධ කෘත්‍රිම චිත්‍රයක් පාඨකයා හමුවේ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු නො වේ. එහෙත් වඩාත් ප්‍රශස්ත සාකල්‍යවාදී මතු කියවීමක් සඳහා අවශ්‍ය විය හැකි විභව නොඑසේ නම් සංලක්ෂ කිහිපයක් අවධාරණය කෙරේ.

පරාක්‍රම කොඩිතුවක්කු හා නන්දන වීරසිංහ තමන්ට අනන්‍ය කාව්‍ය ආස්ථාන ද්විත්වයක් නියෝජනය කරතත් ඔවුන් දෙදෙනා ම 80 දශකයේ අත්දුටු පාරිසරික අර්බුද කිහිපයකි. වනහරණය නොඑසේ නම් සංවර්ධනය පෙරදැරි ව හෝ අනීතික ආකාරයෙන් වන විනාශ සිදු කිරීම් 80 දශකයේ වූ ප්‍රබල පරිසර ප්‍රවාදයකි. එහි වඩාත් වර්ධනාත්මක ස්වරූප වර්තමානයේ හඳුනාගත හැකි ය. මෙම කවීන් දෙදෙනා ම වනහරණ කතිකාව සිය කාව්‍යානුභූතීන් මඟින් පාඨකාවතීර්ණ කළහ. ඊට සමගාමී ව ඔවුන් දෙදෙනා ම කාව්‍යකරණයේ යෙදුණු තවත් පොදු තේමාවක් වූයේ ග්‍රාමීය ජල අයිතීන් උල්ලංඝනය වීම හා කෘෂි ඉඩම් බහුජාතික සමාගම්කරණය වීමේ ප්‍රවාදය යි.

න්‍යායික ව පරාක්‍රම කොඩිතුවක්කු හා නන්දන වීරසිංහ යන කවීන් දෙදෙනා සංස්කෘතික පාරිසරික වාමවාදයේ ස්ථානගත කළ හැකිමුත් පරාක්‍රම කොඩිතුවක්කු කවියාගෙන් විද්‍යමාන වූයේ වාමවාදී (රැඩිකල්) ප්‍රතිරෝධය යි. එහෙත් නන්දන වීරසිංහ ගැමි මනෝභාවය හෙවත් ජනකවි ආස්ථානය නියෝජනය කළේය. එහෙත් පොදුවේ ඔවුන්ගේ පාරිසරික විචාරවාදී තේමාවල පන්ති ගැටුම්, දෘෂ්ටිවාදාත්මක බලපෑම් ආදිය ඉදිරිපත් ව තිබේ. වර්තමානයේ වඩාත් සංකීර්ණ තත්වයට පත් ව ඇති මෙම පාරිසරික අර්බුද මෙම කවීහු යුගලය ඒවායේ ප්‍රාරම්භක අවධියේ ම හඳුනාගනිමින් කවියෙන් රතු සංඥා එළි දැල්වීමට කටයුතු කළහ.

මූලාශ්‍රය

ආනන්ද හිමි, කෝ., 2015. 89න් මතුවුණ නිර්මාණශීලීම කවියා චන්ද්‍රකුමාර වික්‍රමරත්න යි. උපුටාගත්තේ: http://www.jdslanka.org/s/index.php/2014-12-20-03-09-05/2014-12-20-03-12-04/465-kongasdeniye-ananda (ප්‍රවේශ වූ දිනය: 2023-04-15).

කරුණාරත්න, එච්.එන්., 2009. *ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සහ මෑතකාලීන පාරිසරික අර්බුද.* කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

කරුණාරත්න, කේ සහ විජේසූරිය, එස්., 2019. *නව කවි සංග්‍රහය.* කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

කොඩිතුවක්කු, පී., 1985. *සිංහල කවියේ ඊයේ අද සහ හෙට.* කොළඹ: මාර්තු තුන්වන ඉරිදා දින. දිවයින සංග්‍රහය.

කොඩිතුවක්කු, පී., 2018. *70-80 දශකයේ සිංහල කවියේ නව පිපිරුම් තුන: පොඩි මල්ලි, අකීකරු පුත්‍රයා හා අලුත් මිනි-හෙක් ඇවිත්.* කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

ගොඩගේ සහ සහෝදරයෝ, ඇස්,. 2009. *නූතන පද්‍ය සංග්‍රහය.* කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

පරණවිතාන, කේ., 2020. ලංකාගම, සිංහරාජය හා පරිසරවාදය. Colombo Telegraph වෙබ්අඩවිය. උපුටාගත්තේ (https://www.colombotelegraph.com/index.php/-karunarathna-paranawithana-23-august-2020/#comments (ප්‍රවේශ වූ දිනය: 2022-12-07).

ලියනගෙදර, එන්., 2020. *සිංහරාජ වනාන්තරය ගැන නොරතුරු බිඳක්*. Roar මාධ්‍ය සංසදය. උපුටාගත්තේ: https://roar.media/sinhala/main/-features/sinharaja-rain-forest (ප්‍රවේශ වූ දිනය: 2022-11-09).

විජේගුණසිංහ, පී., 2017. *නූතන සිංහල පද්‍ය කාව්‍ය පිළිබඳ විමර්ශනයක්: ජානික ව්‍යාපාරය සම්බන්ධ කවීන්ගේ පටන් අද්‍යතන කවීන් දක්වා*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

වීරසිංහ, එන්., 1984. *ගිංගඟේ විලාපය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

වෙල්ගම, ජේ සහ ගලගමගේ, පී., *2021. ග්‍රාමීය දකුණු ආසියාව: සමාජ විද්‍යාත්මක හා සමාජ මානව විද්‍යාත්මක විමසුමක්*. බත්තරමුල්ල: නෙප්වූන් පබ්ලිකේෂන් සමාගම පි.55-78.

සමාජවාදී කම්කරු සංගමය., *2013. ලාංකේය කම්කරු සටන් ඉතිහාසයේ වමේ භූමිකාව*. පැලවත්ත: නියමුවා ප්‍රකාශන.

සිරිසේන, ඩබ්,එම්., *2010. පාරිසරික සමාජ විද්‍යාව*. වරකාපොළ: ආරිය ප්‍රකාශන.

සිල්වා, කේ.ටී., 1997. *කුලය, පන්තිය හා වෙනස්වන ලංකා සමාජය*. මහනුවර: ප්‍රජා අධ්‍යයාපන කවය.

සුරවීර, ඒ.වී., 2013. *සමාජීය සාහිත්‍ය අධ්‍යයනය*. තෙවන මුද්‍රණය. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සෝමරත්න, වී, බී., 2013. *නූතන පද්‍ය සාහිත්‍ය විචාර සිද්ධාන්ත සහිත අත්පොත*. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

හෙට්ටිආරච්චි, උ., 2015. *විවෘත ආර්ථික ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය*.

Abeyratne, S., (1998). *Economic Change and Political Conflict in Developing Countries with Special Reference to Sri Lanka*. Amsterdam: VU University Press.

Amarasuriya, H., (2016). *Elite Politics and Dissent in Sri Lanka*. National University of Singapore: Institute of South Asian Studies.

Athukorala, P & Rajapathirana, S., (2000). L*iberalization and Industrial Transformation: Sri Lanka in Inter-national Perspective*. Oxford: Ox-ford University Press.

Bawa, R., (2018). *An Ecocritical Anal-ysis of the Indo-Anglian Writing with Special Reference to R.K. Narayan's Under the Banyan Tree*. Udhampur-India: GARI International Jouranal of Multidisciplinary Research.

Biswas, S., (2019). Folk Literature and Environmental Sustainability. *Inter-national Journal of Science and Re-search. Vol-08*.

Brayant, R.L & Bailey, S., (1997). T*hird World Political Ecology*. Lon-don: Roultedge.

Buttel, F.H., (2002). *Environmental Sociology and the Sociology of Nat-ural Resources: Institutional Histo-ries and Intellectual Legacies*. Wis-consin USA: Institute for Environ-mental Studies.

Garrard, G., (2012). *Ecocriticism*. Ab-ingdon: Routledge.

Guha, E., (1998). *Social Ecology*. Noida: Oxford University Press.

Krantz, L., (2001). T*he Sustainable Livelihood Approach to Poverty Re-duction: An Introduction*. Swedish: Division for Policy and Socio-Economic Analysis.

Marland, P., (2013). *Ecocriticism. Insti-tute of Humanities and Creative Arts. Literature Compass*. Retrived from: https://doi.org/10.1111/lic3.12105 (accessed on 14-11-2022).

Merchant, C., (2017). *American Envi-onmental History*: An Introdution. Columbia University Press.

Mishra, S. K., (2016). Ecocriticism: A Study of Environmental Issues in Literature. *BRICS Journal of Educa-tional Research*, 6(4).168-170.

Rao, M., (2019). Environmental Awareness in the Poetry of A.K. Ra-manujan. An *International Journal in English*. Pune Research Centre.

Shiva, V., (1998). *Staying Alive: Wom-en Ecology and Developmen*t. Lon-don: Zed Books.

Sutariya, C.K., (2020). Ecocriticism: A Literary Theory. *Journal of Higher Education and Research Society. Vol-08*.